වාර්ෂික කාර්ය සාධන වාර්තාව

வருடாந்த செயல்திறன் அறிக்கை

Annual Performance Report

2024

ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව

தேசிய சமூக நீர் வழங்கல் திணைக்களம்

Department of National Community Water Supply

නිවාස, ඉදිකිරීම් හා ජල සම්පාදන අමාත්‍යාංශය

வீட்டுவசதி, கட்டுமானம் மற்றும் நீர் வழங்கல் அமைச்சகம்

Ministry of Housing, Construction and Water Supply

2024 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව
වැය ශීර්ෂ අංකය 332

අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

01 පරිච්ඡේදය

ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

ජලය, මූලික මිනිස් අයිතිවාසිකමක් වන අතර, පානීය ජලය නිසි ප්‍රමිතියෙන් යුතුව ප්‍රමාණවත්ව ලබා ගැනීමේ අපහසුතාවයෙන් පෙළෙන ග්‍රාමීය ජනතාව වෙත සුරක්ෂිත පානීය ජලය ලබාදීම සඳහා වන ප්‍රජා මූලික ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන් දශක ගණනාවක් පුරා ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක විය. 2010 වර්ෂය වන විට ආසියානු සංවර්ධන බැංකුව , ලෝක බැංකුව , DANIDA , FINNIDA වැනි ජාත්‍යන්තර සංවිධාන වල පූර්ණ අනුග්‍රහය හා මූල්‍ය දායකත්වය මත ශ්‍රී ලංකා ජනරජය සමග එළඹගත් ගිවිසුම් ප්‍රකාරව දිවයින පුරා මෙලෙස ක්‍රියාවට නංවා ප්‍රජාවට භාර කරන ලද ප්‍රජා ජල ව්‍යාපෘති සංඛ්‍යාව 5000කට ආසන්නව පැවතිනි.

එසේ වුවත්, විවිධ ගැටළු හේතුවෙන් මෙලෙස ආරම්භ කරන ලද ව්‍යාපෘති අතුරින් ප්‍රජා ජල ව්‍යාපෘති 500 කට ආසන්න ප්‍රමාණයක් 2010 දශකය වන විට අකර්මන්‍ය වීමේ අවධානමකට ලක්විණි . මේ බව මනාව තේරුම් ගනිමින් එවකට පැවති රජය එම තත්වය වලක්වා ප්‍රජා ජල ව්‍යාපෘති වල තිරසර භාවය තහවුරු කිරීම උදෙසා ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී.

2014 වසරේ සැප්තැම්බර් මස 19 වැනි දින සිට බලාත්මක වන පරිදි ස්ථාපිත කරන ලද මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වූයේ මෙම ප්‍රජා ජල ව්‍යාපෘති නියාමනය කර ඒවායේ තිරසර භාවය තහවුරු කිරීම වේ.

2014 වර්ෂයේ අග භාගයේ මෙම දෙපාර්තමේන්තුව ස්ථාපිත කරනු ලැබුවත් දෙපාර්තමේන්තුවට අවශ්‍ය නිලධාරීන් බඳවා ගැනීම සඳහා බඳවා ගැනීමේ පටිපාටීන් අනුමත කර ගැනීම, කාර්ය මණ්ඩල පත් කිරීම, ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල ස්ථාපිත කිරීම ඉතා මන්දගාමීව සිදුවීම වැනි හේතු නිසා මහා භාණ්ඩාගාරයෙන් මේ සඳහා වෙන් කරනු ලැබූ ප්‍රතිපාදන ප්‍රමාණයද වාර්ෂිකව රුපියල් මිලියන 100කටත් වඩා අඩු අගයක් ගැනීම, එහි කාර්ය භාරය ඉදිරියට ගෙන යාමට ප්‍රබල බාධාවක්ව පැවතිණි.

2019 වර්ෂය වන විට, මෙම අභියෝග ජය ගනිමින් පවත්නා ජල ව්‍යාපෘති හා ප්‍රජා මූල සංවිධාන නියාමනයෙන් ඔබ්බට ගොස් නව ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමද ආරම්භ කරන ලද අතර, එමගින් ග්‍රාමීය ප්‍රජාවට සුවිශේෂී සේවාවක් හා කාර්ය භාරයක් ඉටු කිරීමට හැකි වන පරිදි දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පුළුල් කරන ලදී. "ප්‍රජා ජල අභිමානි " නමින් වැඩසටහනක් හඳුන්වා දී එමගින් නව ගම්මාන රැසකට සුරක්ෂිත පානීය ජලය ලබාදීම හා අඛණ්ඩව එම වැඩසටහන ඉදිරියට ගෙනයාම මෙහිලා විශේෂයෙන් සඳහන් කල යුතුය .

වාර්ෂිකව රු.මිලියන 100කටත් වඩා අඩු ප්‍රතිශතයක් යටතේ වසර 5කටත් අධික කාලයක් ඉතා මන්දගාමීව ක්‍රියාත්මක වූ මෙම දෙපාර්තමේන්තුවට ඉහත සඳහන් කරන ලද අභියෝග ජයගැනීම නිසාවෙන්ම 2019 වර්ෂයේ සිට රුපියල් මිලියන 1500කට වඩා වැඩි ප්‍රතිපාදන ප්‍රමාණයක් ශ්‍රී ලංකා රජයේ වාර්ෂික අයවැයෙන් අඛණ්ඩව වෙන් කරන ලදී. මෙලෙස දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය පුළුල් කිරීමට කටයුතු කරමින් පවතින මොහොතක විශේෂයෙන්ම 2021 හා 2022 වර්ෂ, සමස්ථ ලෝකයේම ආර්ථිකයේ දැවැන්ත අර්බුධයකට ලක්වූ වසර දෙකක් ලෙස සඳහන් කල යුතුය. කොරෝනා ව්‍යසනය යම්තාක් දුරකට පාලනය

කල හැකි වුවත් තවදුරටත් එමගින් ජනිත කරන ලද ආර්ථික ව්‍යසනයන් ගොඩනගා ගැනීමට බොහෝ ආර්ථිකයන් අසමත් වී ඇත.

මෙම ආර්ථික අර්බුධයෙන් ගොඩ ඒම සඳහා විවිධ ක්‍රමෝපායන් රජය විසින් හඳුන්වා දී ඇති අතර, දේශපාලන අස්ථාවරභාවය , රට බංකොලොත් රාජ්‍යයක් බවට ප්‍රකාශයට පත් කිරීම වැනි හේතු නිසාවෙන් සංවර්ධන වැඩසටහන් වල ප්‍රමුඛතාව දැවැන්ත අභියෝගයකට ලක් කෙරිණි. 2022 වර්ෂයේ, වාර්ෂිකව අයවැයෙන් වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය 50% කින් කපා හැරුණු අතර ඒ හේතුවෙන් අත්හිටවන ලද හා අතරමග නතර කරන ලද ව්‍යාපෘති රාශියක් සඳහා 2023 වර්ෂයේදී අරමුදල් සැපයීමට සිදුවිය.

භාණ්ඩ හා සේවාවල මිල අඛණ්ඩව ඉහල යාම හමුවේ අධි උද්ධමනකාරී තත්වයක් රට තුල නිර්මාණය වූ අතර, සමස්ත ආර්ථිකයම දැඩි අර්බුධකාරී තත්වයකට පත්විය. විශේෂයෙන්ම, ඉදිකිරීම් ක්ෂේත්‍රය දැවැන්ත කඩා වැටීමකට ලක්විණි. මේ තත්වය ප්‍රජා ජල ව්‍යාපෘති වලටද ඉතාමත් අහිතකර ලෙස බලපෑම් කල අතර පවත්නා අභියෝග වලට සාර්ථකව මුහුණ දෙමින් අඛණ්ඩව දෙපාර්තමේන්තුවෙන් අපේක්ෂිත කාර්යභාරය ලබා කරගැනීම උදෙසා විවිධ උපාය මාර්ගයන් භාවිත කරන ලදී.

2024 වර්ෂයේ දී දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය වඩාත් යහපත් තත්වයට පත් කර ගැනීමට හැකිවූ අතර, ප්‍රජාජල අභිමාණී වැඩසටහන යටතේ නව ජල ව්‍යාපෘතිවල වැඩ අවසන් කිරීම මගින් නව ජල සබඳතා 5836ක් ද, නැනෝ ජල ව්‍යාපෘති මගින් නව ප්‍රතිලාභී පවුල් 4170 ක් වෙතද පානීය ජලය ලබා දීමට හැකිවිය. එමෙන්ම මෙම වර්ෂයේ පවතින ජල ව්‍යාපෘති දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම මගින් ප්‍රතිලාභී පවුල් 26 498 ක් දෙපාර්තමේන්තුව සමග බද්ධ කර ගැනීමට හැකිවිය. පසුගිය වර්ෂ කීපය තුළ ජාතික ජල සම්පාදන මණ්ඩලයට පවරා ගැනීම හේතුවෙන් සහ විවිධ හේතූන් මත අක්‍රීය වූ ජල ව්‍යාපෘති පිළිබඳව සමීක්ෂණයක් සිදු කර එම ජල සම්බන්ධතා සංඛ්‍යාව 163 394 ක් ලෙස හඳුනා ගන්නා ලදී. ඒ අනුව මේ වන විට දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ප්‍රජා මූල සංවිධාන මගින් ජලය ලබා දෙන ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව 604 981ක් වන අතර, එය ජාතික ආවරණයෙන් 11% කි.

2024 වර්ෂයේදී ප්‍රජා ජල අභිමාණී වැඩසටහන යටතේ ප්‍රතිලාභී පවුල් 47 667 ඉලක්ක කර ගනිමින් ව්‍යාපෘති 179 ක්‍රියාත්මක කරන ලද අතර ඉන් ව්‍යාපෘති 22 ක වැඩ අවසන් කිරීමට හැකිවිය. එමෙන්ම, පවතින ජල ව්‍යාපෘතින්හි සාමාජික පවුල් 64 100 ඉලක්ක කරමින් සිදුකරන ලද ජල ව්‍යාපෘති පුනරුත්තාපනය කිරීම හා අවශ්‍ය උපාංග ලබා දීම, පිරිපහදු ක්‍රමවේද සකස් කිරීම, දැනුවත් කිරීම් හා පුහුණු වැඩසටහන් සිදුකිරීම, වැසි ජල එක්රැස් කිරීමේ හා සනීපාරක්ෂක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීම, හඳුනා නොගත් වකුගඩු රෝගය පවතින ප්‍රදේශ වලට ජලය සැපයීම ආදී වැඩසටහන් ද ඉතාමත් සාර්ථකව සිදු කරන ලදී.

ප්‍රජා මූලික ජල ව්‍යාපෘති සඳහා ජල ආරක්ෂණ සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන වඩාත් අර්ථවත් කරමින් එම සැලසුම් ක්‍රියාත්මක කිරීම විගණනය කිරීම 2024 වර්ෂයේදී කරන ලදී. මේ යටතේ පුහුණු කරන ලද ජල ආරක්ෂණ සැලසුම් විගණක වරුන් නැවත කැඳවා එම නිලධාරීන් විසින් සිදු කරන ලද විගණන සමාලෝචනයක්ද සිදු කරන ලද අතර, එහිදී ගැටළු රාශියක් හඳුනා ගැනීමට හැකිවිය. එමෙන්ම, ප්‍රජා

ජල සම්පාදන ක්ෂේත්‍රයට නව මංමාවත් විවෘත කිරීමේ අරමුණෙන් යුතුව, එම ජල ව්‍යාපෘති සඳහා සූර්ය බල ශක්තිය ලබා දීමේ එක් වැඩසටහනක් සහ භූගත ජලය පුණරාරෝපණය කිරීමේ වැඩසටහන් 3ක් මෙම වර්ෂයේදී ක්‍රියාත්මක කර අවසන් කරන ලදී.

මෙම වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි ප්‍රජා මූල සංවිධාන විධිමත් කර ඒවායේ තිරසරභාවය සහතික කිරීම සඳහා මෙම වර්ෂය තුළ තීරණ රැසක් ක්‍රියාවට නැංවීම ආරම්භ කරන ලද අතර, විවිධ ආයතන යටතේ ක්‍රියාත්මක වූ ප්‍රජා මූල සංවිධාන දෙපාර්තමේන්තුව වෙත පැවරීම, ප්‍රජා මූල සංවිධාන වලට අයත් වත්කම් කළමනාකරණය වැනි කාර්යයන් සඳහා ක්‍රමවේදයන් සකස් කරන ලදී.

2025 වර්ෂයේ සිට 2029 වර්ෂය දක්වා ක්‍රියාත්මක වන පරිදි දෙපාර්තමේන්තුව සඳහා උපාය මාර්ගික සංවර්ධන සැලැස්මද සකස් කරන ලදී. එම සැලැස්ම මගින් ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ සහ ප්‍රජා ජල ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරන ප්‍රජා මූල සංවිධාන වල වර්තමාන තත්වය හඳුනා ගන්නා ලද අතර, දැනට පවතින ගැටළු සඳහා තිරසාර විසඳුම් ලබා දී සියළුම ප්‍රජා ජල ව්‍යාපෘති මගින් ආරක්ෂිත පානීය ජලය ලබා දීමටත් 2029 වර්ෂ වන විට ජල ආවරණය 14% දක්වා වැඩි කිරීමටත් අපේක්ෂිතය.

වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ නල ජල ආවරණයෙන් සියයට 11%ක් ආවරණය වන්නේ ප්‍රජා ජල ව්‍යාපෘති මගිනි. ජල ව්‍යාපෘති 3783 ක් මගින් ගම්මාන 5000 කටත් වඩා වැඩි 604 981 ක් තරම් වූ පවුල් සංඛ්‍යාවක් මෙමඟින් තම පානීය ජල අවශ්‍යතා සපුරා ගන්නා අතර සමස්ථ ප්‍රතිලාභී සංඛ්‍යාව ගත්විට තිස් ලක්ෂය ඉක්මවූ ජනතාවකට මෙමඟින් සෙත සැලසේ.

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් තම සාමාජික රටවලින් අත්පත් කර ගැනීමට අපේක්ෂා කරන ලද තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා විශේෂයෙන්ම ජනතාවට සුරක්ෂිත පානීය ජලය ලබාදීම සඳහා දෙපාර්තමේන්තුවේ උපරිම කැපවීම හා මැදිහත්වීම 2024 වර්ෂයේ සිදුකල ආකාරය හා කාර්යභාරය මෙම වාර්තාව තුල සම්පිණ්ඩනය කොට දක්වා ඇත.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

තිරසාර ප්‍රජා ජල ව්‍යාපෘති මගින් සුරක්ෂිත පානීය ජලය ලබා දීම

අපේ අරමුණු

- ප්‍රජාවට පිරිසිදු, ආරක්ෂිත පානීය ජලය ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීම.
- ප්‍රජා මූල සංවිධාන මෙහෙයවීම සහ සම්පත් සහ තාක්ෂණය ලබා දීම මගින් සුරක්ෂිත පානීය ජලය සැපයීම සඳහා වන වියදම අවම කිරීම.
- ජල මූලාශ්‍ර සහ ජල පෝෂක ප්‍රදේශ හඳුනා ගැනීම සහ ආරක්ෂා කිරීම සහ ඒ සඳහා ප්‍රජා මූල සංවිධාන මෙහෙයවීම.
- සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය ධනාත්මකව හා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම තුළින් ප්‍රජා ජල යෝජනා ක්‍රම තිරසාරව කළමණාකරණය කිරීම.
- තිරසාර ප්‍රජා ජල ව්‍යාපෘති මෙහෙයවීම සඳහා දෙපාර්තමේන්තුවේ ධාරිතා සංවර්ධනය.

1.3. ප්‍රධාන කාර්යයන්

1. ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂක ක්ෂේත්‍රයට අදාල ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම හා යාවත්කාලීන කිරීම සඳහා සහය වීම.
2. ප්‍රජා මූල සංවිධාන සඳහා ව්‍යවස්ථා හා ගිවිසුම් සම්පාදනය කිරීම.
3. ප්‍රජා මූල සංවිධාන විසින් කරනු ලබන ඉදිකිරීම්, ජල යෝජනා ක්‍රමවල නඩත්තු කටයුතු කළමනාකරණය හා අවශ්‍ය අවස්ථා වලදී තාක්ෂණ සහය ලබා දීම.
4. ප්‍රජා මූල සංවිධාන කාර්ය භාරය පහසු කිරීම සඳහා විවිධ මට්ටම්වලදී අදාළ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමඟ සම්බන්ධීකරණය.
5. ප්‍රජා මූල සංවිධානවල ජල ගාස්තු අය ක්‍රම වඩාත් සාධාරණව හා ක්‍රමවත්ව සකස් කර පවත්වාගෙන යාමට අදාළ නිර්නායක හඳුන්වාදීම හා අධීක්ෂනය.
6. ප්‍රජා මූල සංවිධානවල මූල්‍ය කළමනාකරණය මූල්‍ය විනයක් සහිතව විධිමත්ව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සහය ලබා දීම හා නියාමනය කිරීම.
7. ප්‍රජා මූල සංවිධාන වල කටයුතු ඵලදායී ලෙස සිදු කිරීම සඳහා සහභාගීත්ව පසු විපරම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම.
8. ප්‍රජා මූල සංවිධාන සහ ඔවුන් විසින් කළමනාකරණය කරනු ලබන ජල යෝජනා ක්‍රමවල දීර්ඝ කාලීන පැවැත්ම තහවුරු කරනු වස් උපාය මාර්ග හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීමට ප්‍රජා මූල සංවිධාන පෙළඹවීම හා සහාය වීම. ඒ සඳහා සිදුකල යුතු ප්‍රතිසංස්කරණ හා වැඩිදියුණු කිරීම් සඳහා අවශ්‍ය මූල්‍ය හා තාක්ෂණික සහය ලබාදීම
9. ප්‍රජා මූල සංවිධාන විසින් සපයනු ලබන ජලය අවශ්‍ය සෑම විටකම පිරිපහදු කර ලබා දීමට ප්‍රජා මූල සංවිධාන යොමු කිරීම හා ඊට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම.

10. ප්‍රජා මූල සංවිධාන, ප්‍රාදේශීය සංසද පිහිටුවීම ,දිස්ත්‍රික් සංසද පිහිටුවීම හා ජාතික සංසද පිහිටුවීම.
11. ප්‍රජා මූල සංවිධානවලට අයත් ජල යෝජනා ක්‍රම මඟින් සපයනු ලබන ජලයේ ගුණාත්මක භාවය අඛණ්ඩව නිරීක්ෂනය කිරීම සඳහා ප්‍රායෝගික ක්‍රමවේදයක් හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම.
12. ජල මූලාශ්‍ර සංරක්ෂණය, වැඩිදියුණු කිරීම සහ ජල ආරක්ෂණ සැලැස්ම සකස් කිරීම
13. ප්‍රජා ජල ව්‍යාපෘති වල පැවැත්ම තහවුරු කිරීම සඳහා ප්‍රජාමූල සංවිධානයේ කළමණාකරණ කටයුතු විධිමත් කිරීම සඳහා අවශ්‍ය පුහුණුවීම් ලබාදීම
14. වැසි ජල කළමණාකරණ වැඩසටහන් සහ සනීපාරක්ෂක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
15. අක්‍රිය වී ඇති ප්‍රජා මූල සංවිධාන සක්‍රිය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම.

1.4. සංවිධාන සටහන

මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ජනතාව අතරට ගෙනයාම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් යටතේ පාලනය වන ප්‍රධාන කාර්යාලයකින් හා දිස්ත්‍රික්ක කාර්යාල 25 කින්ද ඊට අදාල කාර්යය මණ්ඩලයකින්ද සමන්විත වේ. දෙපාර්තමේන්තුව සඳහා 503 ක සමස්ථ කාර්යමණ්ඩලයක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර ඇති අතර 2024.12.31 දින වන විට 437 ක සමස්ථ කාර්යය මණ්ඩලයක් සේවය කරයි (මාණ්ඩලික නිලධාරීන් 18 ක් ඇතුළුව). සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි උපාධිධාරියෙකු අනුයුක්ත කර ඇති අතර කලාප ඉංජිනේරුවන් හා තාක්ෂණ නිලධාරීන් කලාප මට්ටමින් අනුයුක්ත කර ඇත.

එහි සංවිධාන ව්‍යුහය පහත පරිදි වේ.

සංවිධාන ව්‍යුහය - ප්‍රධාන කාර්යාලය



දිස්ත්‍රික් සංවිධාන ව්‍යුහය



1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

2014 වර්ෂයේ ආරම්භ කළ මෙම දෙපාර්තමේන්තුව අධ්‍යක්ෂ ජනරාල් වරයෙක් යටතේ පාලනය වන අතර වර්තමානය වන විට ප්‍රධාන කාර්යාලයකින් හා දිස්ත්‍රික් කාර්යාල 25 කින් සමන්විත වේ. ප්‍රධාන කාර්යාලය පහත සඳහන් අංශ යටතේ ක්‍රියාත්මක වේ.

1. පාලන අංශය
2. සංවර්ධන හා සැළසුම් අංශය
3. ගිණුම් අංශය
4. තාක්ෂණ අංශය
5. ප්‍රසම්පාදන අංශය
6. මෙහෙයුම් හා ඇගයුම් අංශය
7. අභ්‍යන්තර විගණන අංශය
8. දිස්ත්‍රික් කාර්යාල

පාලන අංශය

ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යභාරය හා වගකීම් ඉටුකරමින් මහජනතාවට කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සැපයීම සඳහා මානව සම්පත් හැසිරවීම හා දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනයට සහය වීම පාලන අංශයට පැවරී ඇති කාර්යභාරය වේ. දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා සේවාස්ථ හා මානව සම්පත් සංවර්ධනයට අදාල පුහුණු වැඩසටහන් සංවිධානය පාලන අංශය විසින් සිදුකරනු ලැබේ. මෙම සියළු කටයුතු කළමණාකරණය කිරීම ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 පන්තියේ අධ්‍යක්ෂවරයෙක් සහ නිලධාරීන් 17 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් සේවය කරයි

සංවර්ධන හා සැලසුම් අංශය

සංවර්ධන හා සැලසුම් අංශය දෙපාර්තමේන්තුවට අදාල සියලුම සංවර්ධන හා සැලසුම් කටයුතු මෙම අංශය මගින් සිදුකරයි. දිස්ත්‍රික් මට්ටමින් සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීම, ඒ අනුව වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීම, සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ව්‍යාපෘති වාර්තා සකස් කිරීම ඇතුළු ඍජුව සංවර්ධනයට අදාළ වෙනත් ක්‍රියාකාරකම් රැසක් මෙම අංශය මඟින් ඉටු කරනු ලබයි. මෙම සියළු කටයුතු අධීක්ෂණය හා සුපරීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ 1 පන්තියේ අධ්‍යක්ෂවරයෙක් සහ නිලධාරීන් 7 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් සේවය කරයි

ගිණුම් අංශය

මෙම අංශය මගින් දෙපාර්තමේන්තුවට අදාළ සියලු ගෙවීම් කටයුතු සිදුකිරීම , මාසික, වාර්ෂික ගිණුම් වාර්තා පිළියෙල කිරීම හා භාණ්ඩාගාරයට ලබා දීම, අවසාන ගිණුම් සකස් කිරීම , අත්තිකාරම් පියවීම් කටයුතු, විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීම, ගිණුම් කාරකසභා කටයුතුවලදි ඒ සම්බන්ධ

සම්බන්ධීකරණ කටයුතු කිරීම, වාර්ෂික ගිණුම් පියවීමේ කටයුතු මෙම අංශය මගින් සිදුකරන ප්‍රමුඛතම කාර්යය වේ. මෙම සියළු කටයුතු අධීක්ෂණය හා සුපරීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ 1 පන්තියේ ප්‍රධාන ගණකාධිකාරීවරයෙක් සහ නිලධාරීන් 12 දෙනෙක් සේවය කරයි .

තාක්ෂණ අංශය

දෙපාර්තමේන්තුවට අදාළ සියළුම තාක්ෂණ කාර්යයන් මෙම අංශය මගින් ඉටු කරනු ලබයි. නව ජල ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතු සඳහා සැලසුම් සහ ඇස්තමේන්තු සකස් කිරීම, පවතින ව්‍යාපෘති වල පුනරුත්ථාපන කටයුතු හා නඩත්තු කටයුතු සඳහා අදාල සියලු ඇස්තමේන්තු සකස් කිරීම, ඉදිකිරීම් කටයුතු පරීක්ෂාකර අවශ්‍ය තාක්ෂණ උපදෙස් ලබාදීම, ඉදිකිරීම් අධීක්ෂණය, බිල්පත් පරීක්ෂා කර අනුමැතිය ලබාදීම, තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ පුහුණුවීම් සංවිධානය, ප්‍රජා ජල ව්‍යාපෘති නඩත්තුව පිළිබඳ ප්‍රජා මූල නියෝජිතයන්ට අවශ්‍ය පුහුණුව ලබා දීමට සහය වීම, වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීමට සහය වීම ආදිය මෙම අංශයෙන් කරන ප්‍රධානම කාර්යයන් වේ. මෙම සියළු කටයුතු ප්‍රධාන කාර්යාලයේ, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ 1 පන්තියේ අධ්‍යක්ෂවරයෙක්, ඉංජිනේරුවරුන් 1ක් සහ කාර්ය මණ්ඩලය 9 දෙනෙක් විසින්ද, කලාප මට්ටමින් ඉංජිනේරුවරු 09 ක්, තාක්ෂණ නිලධාරීන් 27 ක් විසින්ද ඉටු කරනු ලබයි.

ප්‍රසම්පාදන අංශය

දෙපාර්තමේන්තුවේ කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මිලදී ගැනීම් කටයුතු මෙන්ම ප්‍රජා ජල ව්‍යාපෘති වල කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සියළු මිලදී ගැනීම් කටයුතු ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ මූල්‍ය රෙගුලාසි වලට අනුව සිදුකිරීම මෙම අංශයේ කාර්යයභාරය වේ. මෙම සියළු කටයුතු අධීක්ෂණය හා සුපරීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ 1 පන්තියේ අධ්‍යක්ෂක වරයෙක් සහ කාර්ය මණ්ඩලය 06 දෙනෙක් සේවය කරයි. කෙසේ වෙතත් මේ වන විට අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) තනතුර පුරප්පාඩු වී පවතී.

මෙහෙයුම් හා ඇගයුම් අංශය

දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන සියලු සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති මෙන්ම දැනට දිවයින පුරා ස්ථාපිත කර ඇති සියළු ප්‍රජා මූල සංවිධාන නිසි අධීක්ෂණයට හා සුපරීක්ෂණයට හා ඇගයීමට ලක් කිරීමේ කාර්යයභාරය මෙම අංශය මගින් සිදුකරනු ලබයි. සැලසුම් කරනු ලබන ව්‍යාපෘති කාර්යක්ෂමව හා ඵලදායීව නිමා කොට ජනතාවට ප්‍රතිලාභ අත්පත් කර දීමට මෙම අංශය දැඩි මැදිහත්වීමකින් කටයුතු කරයි. විශේෂයෙන් ලෝක බැංකු ආධාර යටතේ මේ සම්බන්ධයෙන් නවීන තාක්ෂණයෙන් යුතු කළමනාකරණ තොරතුරු පද්ධතියක් සකස් කර ඇත. ඒ තුලින් ග්‍රාමීය ජල සම්පාදන ක්ෂේත්‍රයේ විධිමත් සංවර්ධනයට හා සැලසුම්කරණයට අදාල ඉතාමත් නිවැරදිවූත් යාවත්කාලීනවූත් දත්ත හා තොරතුරු මෙම අංශයෙන් ලබාගැනීමට හැකිවීම විශේෂ ජයග්‍රහණයකි. සියළු ප්‍රජා ජල ව්‍යාපෘති ඇතුලත් පරිගණකගත තොරතුරු පද්ධතියක් සකස් කිරීම, ජනතාවට ක්ෂණික දුරකථන ඇමතුම් ලබා දීමේ පහසුකම (1914) සැලසීම මගින් ගැටළු සඳහා විසඳුම් ලබාදීම ඉක්මන් කිරීම, ප්‍රජා මූල සංවිධාන

කටයුතු පිළිබඳ සමීප අධීක්ෂණයක් සිදුකිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම හරහා ජනතාවට ඉතා කඩිනම් හා කාර්යක්ෂම සේවාවක් සැපයීම මෙන්ම සංවර්ධන ව්‍යාපෘති ඉතාමත් ඵලදායීව හා කාර්යක්ෂමව මෙහෙයවීම මෙම අංශය තුලින් සිදුකරනු ලබයි. එමෙන්ම,ජල ආරක්ෂණ සැලසුම් සකස් කිරීම, ඒ සඳහා පුහුණු කිරීම, විගණනය කිරීම සහ පසු විපරම් කිරීමද, ප්‍රජා මූල සංවිධාන සම්බන්ධ සියළු පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීම, භූගත ජලය පුණරාරෝපනය ඇතුළු නව තාක්ෂණය ප්‍රජා මූල සංවිධාන වෙත හඳුන්වා දීම, ප්‍රගති සමාලෝචනය සහ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු ආදියද මෙම අංශය මගින් සිදු කරනු ලබයි. මෙම සියළු කටයුතු අධීක්ෂණය හා සුපරීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ 1 පන්තියේ අධ්‍යක්ෂවරයෙක්, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ 11 පන්තියේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙක් සහ නිලධාරීන් 4 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් සේවය කරයි.

අභ්‍යන්තර විගණන අංශය

මෙම අංශය වෙනම ඒකකයක් ලෙස 2020 වර්ෂයේදී ස්ථාපිත කරන ලදී. ආයතනය මගින් සිදුකරන කාර්යයන් වඩාත් නිවැරදිව සිදුකිරීමත්, අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය විනිවිදභාවයකින් නිවැරදි ක්‍රමවේදයකට සිදුකිරීමට යොමුකිරීම තුල සිදුවන වැරදි අඩුපාඩු අවම කිරීමත් මෙම අංශය පිහිටුවීමේ මූලික අරමුණ වේ. එමෙන්ම ප්‍රජා ජල ව්‍යාපෘති වල සිදුවන වැරදි අඩුපාඩු අවම කර නිවැරදි ක්‍රියාවලියක් තුල සංවිධාන ගමන් කරවීමත්, වංචා දූෂණ සිදුවීමට ඇති අවස්ථා අවම කරවීමට ක්‍රියාමාර්ග ගැනිමත් මෙ තුලින් අපේක්ෂිත තවත් අරමුණක් වේ. මෙම සියළු කටයුතු අධීක්ෂණය හා සුපරීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ II පන්තියේ අභ්‍යන්තර විගණක තනතුරක් අනුමත කර ඇති අතර, ඒ අනුව අදාල අංශය ස්ථාපිත කෙරිනි. 2020 වර්ෂයේ මෙම විගණන අංශය විධිමත්ව ස්ථාපිත කරනු ලැබුවත් පුරප්පාඩු වූ II පන්තියේ ගණකාධිකාරී වරයෙකු පත්කර ගැනීමේ අපහසුතාවය මත මෙහි කටයුතු අකර්මණ්‍යව පවතී . රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට මේ පිළිබඳව දැනුම් දී ඇති අතර ඉතා කඩිනමින් මෙම ගැටළුවට විසඳුම් ලබාදීමට අපේක්ෂා කෙරේ.

දිස්ත්‍රික් කාර්යාල

ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ජනතාවට වඩාත් සමීප කරවීම සඳහා සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දිස්ත්‍රික් කාර්යාල 25ක් පිහිටුවා ඇත. දිස්ත්‍රික්කයේ පවතින ප්‍රජා ජල අවශ්‍යතා හඳුනා ගැනීම, ප්‍රමුඛතා ගත කිරීම, ප්‍රජාමූල සංවිධාන ගොඩනැගීම, පවතින ප්‍රජාමූල සංවිධාන ශක්තිමත් කිරීම හා නියාමනය කිරීම, හඳුනාගත් ජල අවශ්‍යතා පාදක කරගනිමින් ව්‍යාපෘති සැලසුම් හා වාර්තා සකස් කර අදාල පාර්ශව වෙත යොමුකර අවශ්‍ය අරමුදල් සම්පාදනය කර ගැනීම, ප්‍රජා මූල සංවිධාන වල ගැටළු හඳුනාගැනීම, විසඳුම් ලබාදීම හා ධාරිතා සංවර්ධනය, අවශ්‍ය තාක්ෂණික සහය ලබාදීම හා ජලයේ ගුණාත්මක තත්වය පවත්වාගෙන යාම සඳහා සහ ජල ආරක්ෂණ සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රජා මූල සංවිධාන යොමුකර වීම, ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීමට ජනතාව පෙළඹවීම හා තොරතුරු රැස් කිරීම, යාවත්කාලීන කිරීම හා කළමණාකරන දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම ආදිය දිස්ත්‍රික් කාර්යාල මගින් ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යය වේ.

එම කාර්යභාරය ඉටුකිරීම සඳහා සෑම දිස්ත්‍රික්කයකම දිස්ත්‍රික් ස්ථාන භාර නිලධාරියෙකු යටතේ සමස්ථ දිස්ත්‍රික්කයම ආවරණය කල හැකි වන පරිදි දිස්ත්‍රික්කයේ විශාලත්වය, ප්‍රජා මූල සංවිධාන සංඛ්‍යාව, පවත්නා නල ජල ආවරණය වැනි සාධක පාදක කර ගනිමින් සංවර්ධන නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලයක් අනුයුක්තව සේවය කරනු ලබයි.

මීට අමතරව තාක්ෂණික මග පෙන්වීම් ලබා දීම සඳහා පළාත් මට්ටමින් දිස්ත්‍රික් ඉංජිනේරුවරු හා තාක්ෂණ නිලධාරීන් අනුයුක්ත කර ඇත.

කෙසේ වෙතත්, පවතින දිස්ත්‍රික් සංවිධාන ක්‍රමය අධ්‍යනය කිරීමෙන් පසු වර්තමානයේ මුහුණ දෙන අභියෝගවලට සාර්ථක විසඳුම් ලබා දිය හැකි පරිදි දිස්ත්‍රික් මට්ටමේ කළමණාකාරිත්වය වඩාත් ශක්තිමත් කිරීමට නව සංවිධාන ව්‍යුහයක් සහ කාර්ය මණ්ඩලයක් අනුමැතියට යොමු කර ඇත.

1.6. අමාත්‍යංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතේ පවතින ආයතන/ අරමුදල්

දෙපාර්තමේන්තුවේ සියළු පාලන හා මූල්‍ය කටයුතු මධ්‍යගතව සිදුකරන අතර ප්‍රජා ජල ව්‍යාපෘති වල කටයුතු දිස්ත්‍රික් කාර්යාල හරහා සිදුකරනු ලබයි. එම කාර්යභාරය ජනතාවට වඩාත් සමීප කරවීම සඳහා සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දිස්ත්‍රික් කාර්යාල පිහිටුවා ඇත

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

දෙපාර්තමේන්තුව යටතේ සෘජුව ක්‍රියාත්මක වන ව්‍යාපෘති නොමැති අතර ජල සම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක WASSIP ව්‍යාපෘතිය, CRIWMP හා UNICEF ව්‍යාපෘති වල පාර්ශවකරුවෙකු ලෙස දෙපාර්තමේන්තුව කටයුතු කරයි. එමෙන්ම, චීන ශ්‍රී ලංකා සහයෝගිතා පර්යේෂණ සහ ආදර්ශණ මධ්‍යස්ථානය (JRDC) සහ චීනයේ RECAS ආයතනය සමගද දෙපාර්තමේන්තුව සහයෝගීව කටයුතු කරනු ලබයි.

02 පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ ජයග්‍රහණ , අභියෝග හා ඉදිරි ඉලක්ක

2.1 2024 වර්ෂයේ ක්‍රියාත්මක කල සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති

ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවට 2024 වාර්ෂික අයවැයෙන් වෙන් කරනු ලැබූ සමස්ථ ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 1734.22 ක් වන අතර පලාත් සභාවේ හා විවිධ ආයතන වල ඉල්ලීම් පාදක කරගනිමින් අමතර රු.මිලියන 43.26 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් ලබා ගැනීමට හැකිවිය. ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන මගින් ව්‍යාපෘති 435 ක්ද, ජල සම්පාදන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මගින් ව්‍යාපාති 13 ක්ද ක්‍රියාත්මක කිරීමට හැකිවූ අතර, යුනිසෙෆ් ආයතනය වෙන් කරන ලද අමතර ප්‍රතිපාදන මගින් ව්‍යාපෘති 2 ක්‍රියාත්මක කරන ලදී. ආරම්භ කරන ලද ව්‍යාපෘති අතුරින් 169 ක වැඩ නිම කිරීමට හැකිවූ අතර මෙම ව්‍යාපෘති මගින් පවුල් 35 000 කට පමණ ප්‍රතිලාභ සැලසීමට හැකිවිය.

2.1.1 සමස්ථ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය

අනුමත කළ ව්‍යාපෘති සංඛ්‍යාව	475
සම්පූර්ණ කළ ව්‍යාපෘති සංඛ්‍යාව	169
දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති සංඛ්‍යාව	306
ලැබුණු මුළු ප්‍රතිපාදන	1878.252
මුළු වියදම රුපියල් මිලියන	985.75
අතැති බිල්පත් රුපියල් මිලියන	0

2.1.2 දෙපාර්තමේන්තු ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කල ව්‍යාපෘති වල ප්‍රගතිය

	වැඩසටහන	ක්‍රියාත්මක ව්‍යාපෘති	ලැබුණු මුළු ප්‍රතිපාදන (රු.මි.)	අනුමත කළ ව්‍යාපෘති සංඛ්‍යාව	මූල්‍ය ප්‍රගතිය		භෞතික ප්‍රගතිය	
					වියදම (රු.මි.)	අතැති බිල්පත් (රු.මි.)	ක්‍රියාත්මක ව්‍යාපෘති	නිමි ව්‍යාපෘති
1	ප්‍රජා ජල අභිමාණී වැඩසටහන	දිස්ත්‍රික්ක 25 සඳහා ආරම්භ කරන ලද නව ව්‍යාපෘති 179 ක වැඩ අවසන් කිරීම.	1231.23	179	663.44	0	157	22
2	ප්‍රජා ජල ව්‍යාපෘති වැඩි දියුණු කිරීම	පවතින ව්‍යාපෘති පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම සඳහා වන අවිච්ඡේද ව්‍යාපෘති 74 ක වැඩ අවසන් කිරීම.	213.293	74	255.34	0	122	131
		සනීපාරක්ෂක වැඩසටහන යටතේ අවිච්ඡේද ව්‍යාපෘති 294 ක වැඩ අවසන් කිරීම.	4.5	8				
		පොදු සනීපාරක්ෂක වැඩසටහන යටතේ අවිච්ඡේද ව්‍යාපෘති 8ක වැඩ අවසන් කිරීම	7	8				
		ප්‍රජා ජල ව්‍යාපෘති 30ක් සඳහා නැනෝ පිරිපහදු පද්ධති ස්ථාපනය කිරීම.	35.35	30				
		ප්‍රජා ජල ව්‍යාපෘති 68 ක පුනරුත්තාපන වැඩ අවසන් කිරීම.	218.49	68				
		දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ජංගම සේවා පැවැත්වීම.	1	5				
		දිස්ත්‍රික්ක 21ක ප්‍රජා මූල සංවිධාන සාමාජිකයින් සඳහා පුහුණු වැඩසටහන් 50 ක් ක්‍රියාත්මක කිරීම.	5	50				
		ආපදා අවස්ථා වලදී ප්‍රජා මූල ජල ව්‍යාපෘති සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.	15.36	10				
3	ජල ආරක්ෂණ සැලැස්ම	ප්‍රජා ජල ව්‍යාපෘති සඳහා ජල ආරක්ෂණ සැලසුම් සහ භූගත ජලය පුනරාරෝපණය ' සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.	3	3	3	0	0	3
			1737.223	**435**	**921.78**	**0**	**279**	156

2.2 විශේෂ ජයග්‍රහණ

2022 වර්ෂයේ රටක් ලෙස දැඩි ආර්ථික අර්බුදයකට ලක්වීම මත සියළු ක්ෂේත්‍රවල කඩාවැටීමක් සිදුවූ අතර, ඒ හේතුවෙන් ක්‍රියාත්මක කරමින් පැවති විශාල ව්‍යාපෘති සංඛ්‍යාවක් 2023 වසර සඳහා අවිඡේද කිරීමට සිදුවිය. එසේ වුවත්, 2023 වර්ෂයේ මෙම ගැටළු යම් ප්‍රමාණයක් විසඳා ගැනීමට හැකිවූ අතර 2024 වසරේ දී ජයග්‍රහන කීපයක්ම අත්පත් කර ගැනීමට හැකිවිය.

1. ගම් දහසකට සුරක්ෂිත පානීය ජලය ලබාදීමේ අරමුණින් මධ්‍යකාලීන වැඩසටහනක් ලෙස නව ජල ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා ආරම්භ කල ප්‍රජා ජල අභිමානි වැඩසටහන අඛණ්ඩව ඉදිරියට ගෙනයාම.
2. දේශීය අරමුදල් සපයාගැනීමේ අර්බුදයට පිළියමක් ලෙස ලෝක බැංකුව, යුනිසෙෆ් සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල-UNDP (CRIWMP) වැඩසටහන් හරහා විශාල ව්‍යාපෘති ප්‍රමාණයකට අවශ්‍ය ප්‍රාග්ධනය සපයා ගැනීම.
3. ලෝක බැංකුව, යුනිසෙෆ් සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල-UNDP (CRIWMP) වැඩසටහන් හරහා දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරීන් සහ ප්‍රජා මූල සංවිධාන වල නිලධාරීන් හා සාමාජිකයින් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කිරීම.
   - WASSIP ව්‍යාපෘතිය යටතේ ජල පිරිපහදු තාක්ෂණය පිළිබඳව ඉංජිනේරුවරුන් සහ තාක්ෂණ නිලධාරීන් පුහුණු කිරීම හා ජල පිරිපහදු පද්ධති ස්ථාපනය කිරීම.
   - UNDP ප්‍රතිපාදන යටතේ තාක්ෂණික ධාරිතා සංවර්ධනය සහ ව්‍යාපෘති සැලසුම්කරණය පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණු කිරීම හා ප්‍රජා මූල සංවිධාන අතර දැනුම බෙදා ගැනීම සහ සම්බන්ධීකරණය පිළිබඳ දැනුවත් කිරීම් සිදු කිරීම
4. මාරාන්තික වකුගඩු රෝගයට පිළියමක් ලෙස උතුරු පළාතේ දිස්ත්‍රික්ක 3 ක නැවත පදිංචි කරන ලද ජනතාව සඳහා නැනෝ පිරිපහදු යන්ත්‍ර 50ක් ස්ථාපනය කිරීම වැඩ අවසන් කිරීම හා එම ව්‍යාපෘති ප්‍රජාව වෙත බාර දීම.
5. ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ හඳුන්වා දෙන ලද දත්ත පද්ධතිය, වැඩිදියුණු කිරීම හා යාවත් කාලීන කිරීම
6. දෙපාර්තමේන්තුව සඳහා 2025-2029 උපාය මාර්ගික සංවර්ධන සැලැස්ම සකස් කිරීම.
7. ප්‍රමාණවත් තාක්ෂණික සහ අනෙකුත් කාර්ය මණ්ඩල නොවූවද පෙර වසරට සාපේක්ෂව ඉහළ ප්‍රගතියක් අත්පත් කර ගැනීමට හැකිවීම.
8. පවතින ගැටළු සහ විගණනයෙන් පෙන්වා දී ඇති ගැටළු සැළකිල්ලට ගෙන පවතින මාර්ගෝපදේශ යාවත් කාලීන කිරීම සහ නව පටිපාටි හඳුනවා දීම 2025 මුල් භාගයේ සිට ආරම්භ කිරීම.

2.3 . ඉදිරි ඉලක්ක

තිරසර සංවර්ධන අරමුණු යටතේ වර්ෂ 2030 වනවිට සැමට සුරක්ෂිත පානීය ජලය ලබාදීම සඳහා එහි සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාවද බැදී සිටින බැවින් ඉදිරි කාලය දෙපාර්තමේන්තුවට ඉතා අභියෝගාත්මක කාලයක් ලෙස හැඳින්විය හැකිය. පවතින අර්බුද කාලය තුල පවතින සම්පත් කළමනාකරණය කරගනිමින් ග්‍රාමීය ප්‍රජාවට සුරක්ෂිත පානීය ජලය ලබාදීම සඳහා දෙපාර්තමේන්තුවේ ඉදිරි ඉලක්ක සකස් කර ඇත.

- දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සියළු ප්‍රජා ජල ව්‍යාපෘති රජයට බරක් නොවී පවත්වාගෙන යා හැකි ආකාරයට එම සංවිධාන බලගැන්වීම
- පසුගිය දශක හතරක කාල සීමා තුල ස්ථාපිත කර ඇති ප්‍රජා ජල ව්‍යාපෘති වලින් ලබාදෙන ජලයේ ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය කරන පිරිපහදු ක්‍රම ස්ථාපිත කිරීම.
- ජාතික ජල සම්පාදන මණ්ඩලයට ජලය සැපයිය නොහැකි දුෂ්කර ගම්මාන දහසකට සුරක්ෂිත පානීය ජලය ලබාදීමේ අරමුණින් මධ්‍යකාලීන වැඩසටහනක් ලෙස ආරම්භ කල ප්‍රජා ජල අභිමාණී වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම
- සෑම ප්‍රජා ජල ව්‍යාපෘතියකටම ජල ආරක්ෂණ සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීම
- සියළු ප්‍රජා ජල ව්‍යාපෘතිවලට අයත් ජල පෝෂක ප්‍රෙද්ශ සංරක්ෂණය කිරීම.
- ග්‍රාමීය ජල සම්පාදන කෂේත්‍රයට ස්ථාපිත කල ජාතික දත්ත පද්ධතිය යාවත්කාලීන කර පවත්වාගෙන යාම
- ග්‍රාමීය හා වතු ප්‍රජාව පාදක කර ගනිමින් සනීපාරක්ෂක වැසිකිළි පහසුකම් වලින් 100% ඉලක්කය කරා ලගාවීම
- වකුගඩු රෝගය බහුලව පවතින ප්‍රදේශ වල ජනතාවට සුරක්ෂිත පානීය ජලය ලබාදීම සඳහා පිරිපහදු පද්ධති ස්ථාපිත කිරීම (RO Plant/Nano Plant/EDR Plant)
- අතිශය දුෂ්කර හා පානීය ජල හිගකමින් පීඩා විදින ජනතාව සඳහා වැසි ජල එක්රැස්කරන පද්ධති ලබා දීම හා පෞද්ගලික සහ රාජ්‍ය සහයෝගීතාවයෙන් (PPP) යුතුව ජල වයපෘති ක්‍රියාත්මක කිරීම.

2.3 . අභියෝග

1. ප්‍රජා මූල සංවිධාන නියාමනයට පවතින නීතිමය රාමුව අනුමත වීමේ කාල ප්‍රමාදය.
2. ආර්ථික අර්බුදය හමුවේ ප්‍රජා ජල ව්‍යාපාති සංකල්පය තුල ව්‍යාපෘති වල අඛණ්ඩ පැවැත්මට අත්‍යවශය සාධකයක් වන ප්‍රජා දායකත්වය ලබාගැනීමේදි ගැටළු මතුවීම.
3. පවතින ජල මූලාශ්‍ර අපවිත්‍ර වීම හේතුවෙන් මතුවී ඇති අර්බුද

   - දේශගුණික විපර්යායන්, මිනිසාගේ විවිධ වූ ක්‍රියාකාරකම්, නාගරීකරණය හා රටතුල සිදුවන සංවර්ධන ක්‍රියාදාමයන් හේතුවෙන් ජල මූලාශ්‍ර අපවිත්‍ර වීම හා, දූෂණය වීම සිදුවී ඇත.

4. දේශගුණික විපර්යාසයන් හේතුවෙන් ජල උල්පත් සිදී යාම, මෙන්ම සැලසුම් කරන ලද ව්‍යාපෘති වල ඉලක්ක ගත කණ්ඩායම සැලැස්ම අභිබවා යමින් ප්‍රතිලාභ ලබාදීමට ක්‍රියාකිරීම තුල ජල උල්පත් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ප්‍රජා මූලික ජල ව්‍යාපෘති අක්‍රිය වීමේ අවධානම.
5. දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති මගින් පිරිපහදු නොකර බෙදාහරින ජලය පිරිපහදු කිරීමට ඇති ගැටළුව. දශක හතරකට අධික කාලයක් තුල බහුතර ව්‍යාපෘති ප්‍රමාණයක පිරිපහදු කිරීමකින් තොරව ජලය ලබාදෙන අතර ව්‍යාපෘති සැලසුම තුල පිරිපහදු පද්ධතියක් ඇතුලත් නොවීම හේතුවෙන් නැවත අළුතෙන් පිරිපහදු පද්ධති සැලසුම් කිරීමේදී අමතර පිරිවැයක් දැරීමට සිදුවීම.
6. ප්‍රජා මූල ජල ව්‍යාපෘතීන්හි ජලයේ ගුණාත්මය නියමිත පරිදි පරීක්ෂා කිරීම සඳහා ප්‍රමාණවත් පහසුකම් නොමැතිවීම, ඒ සඳහා වියදම් අධික වීම හා රසායණ ද්‍රව්‍ය හිග වීම.
7. විදුලිය බලය සඳහා වන අයකිරීම් ඉහළ යාමත් සමග විදුලිය බලය භාවිතා කරන ප්‍රජා මූල ජල ව්‍යාපෘතීන්හි වියදම් දරාගත නොහැකි මට්ටමට ඉහළ යාම හේතුවෙන් ප්‍රජා මූලික ජල ව්‍යාපෘති වල තිරසරභාවය අභියෝගයට ලක්වීමේ අවධානම.
8. ජාතික ජල සම්පාදන හා ජලාපවහණ මණ්ඩලය විසින් ජලය සඳහා වන අයකිරීම් ඉහළ යාමත් සමග එම මණ්ඩලය මගින් තොග ජල සැපයුම් ලබා ගන්නා ප්‍රජා මූල ජල ව්‍යාපෘතීන්හි වියදම් දරාගත නොහැකි මට්ටමට ඉහළ යාම හේතුවෙන් ප්‍රජා මූලික ජල ව්‍යාපෘති වල තිරසරභාවය අභියෝගයට ලක්වීමේ අවධානම.
9. දෙපාර්තමේන්තුවේ පවතින කාර්ය මණ්ඩල හිගය.
10. විවිධ ආයතන විසින් ප්‍රජාව වෙත නොමිලයේ ජල සම්පාදනය කිරීම (විශේෂයෙන්ම නැනෝ සහ ආර්ඕ ජල පිරිපහදු පද්ධති) හේතුවෙන් එම ප්‍රදේශවල ජලය සැපයීමේදී ප්‍රජාව දෙපාර්තමේන්තු ක්‍රමවේදයට අනුගත වීමට ඇති අකමැත්ත හේතුවෙන් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති ඵලදායී නොවීම.

....

ගණන්දීමේ නිලධාරි

....

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි

3 පරිච්ඡේදය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ එෆ්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදනා 2024		සටහන	තත්‍ය		
			2024	2023	
රු.			රු.	රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
2,150,953,950	භාණ්ඩාගාර අග්‍රිම		1,523,447,017	1,000,913,619	ඒසීඒ-3
100,000,000	තැන්පතු		133,043,184	134,171,377	ඒසීඒ-4
20,000,000	අත්තිකාරම් ගිණුම්		15,850,464	10,015,711	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්				
2,270,953,950	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**1,726,800,257**	**1,169,607,116**	
2,270,953,950	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**1,726,800,257**	**1,169,607,116**	
26,020,457	**භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)**		26,020,457		
2,244,933,493	**ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)**		1,700,779,799	1,169,607,116	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්		-	-	ඒසීඒ-2(ii)
314,167,250	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	312,409,143	270,995,224	ඒසීඒ-2(ii)
124,240,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	117,852,307	88,832,767	ඒසීඒ-2(ii)
900,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	613,663	728,902	ඒසීඒ-2(ii)
-	පොළී ගෙවීම්	8	-	-	ඒසීඒ-2(ii)
300,000	වෙනත් පුනරාවර්තන වියදම්	9	144,000	112,500	ඒසීඒ-2(ii)
439,607,250	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**431,019,114**	**360,669,394**	

	මූලධන වියදම්				
14,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	4,592,357	4,094,583	
31,015,512	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	31,015,504	804,858	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	-	-	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
1,000,000	හැකියා වර්ධනය	**14**	943,114	535,396	
1,734,232,238	වෙනත් මූලධන වියදම්	**15**	922,070,659	530,863,592	
1,780,247,750	**මුළු මූලධන වියදම් (උ)**		**958,621,633**	**536,298,429**	
	තැන්පතු ගෙවීම්		180,699,420	88,497,077	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		21,562,117	12,641,670	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		202,261,537	101,138,747	
2,219,855,000	**මුළු වියදම් එ = (ඊ+උ+ඌ)**		1,591,902,284	998,106,569	
25,078,493	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		108,877,515	171,500,547	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		108,877,515	171,500,547	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය			-	ඒසිඒ-3
				-	

ඒසීඒ-පී

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තත්‍ය	
		2024	**2023**
		රු.	රු.
<u>මූල්‍ය නොවන වත්කම්</u>	-		-
	-		-
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	1,076,070,995	125,984,833
<u>මූල්‍ය වත්කම්</u>			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	31,757,659	26,046,006
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**1,107,828,654**	**152,030,839**
<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		-195,255,479	-248,623,368
දේපළ පිරියත හා උපකරණ සංචිතය		1,076,070,995	125,984,833
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**		
<u>ජංගම වගකීම්</u>			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	227,013,138	274,669,374
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**1,107,828,654**	**152,030,839**

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	සතය	
	2024	**2023**
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		-
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	54,459,591	24,506,408
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	1,523,447,017	1,000,913,619
අත්තිකාරම් අයකර ගැනීම්	12,070,722	10,434,334
තැන්පතු ලැබීම්	133,043,184	134,171,377
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**1,723,020,515**	**1,170,025,739**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	1,387,642,245	895,111,724
සහනාධාර සහ මාරුකිරීම්	613,663	728,902
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	107,097,515	172,510,970
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	26,020,457	-
අත්තිකාරම් ගෙවීම්	20,004,100	12,641,670
තැන්පතු ගෙවීම්	180,699,420	88,497,077
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**1,722,077,400**	**1,169,490,342**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**943,114**	**535,396**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		

පොලී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**-**	**-**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**-**	**-**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**943,114**	**535,396**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්	-	-
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්		

	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-
	-	-

පිටු අංක 19 .සිට 20 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 21 සිට 23 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

....	....	....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරී	ගණන්දීමේ නිලධාරී	ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	දිනය :
දිනය :	දිනය :	

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2024 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව එම තොරතුරු මූල්‍ය ප්‍රකාශවල අදාළ පරිදි ඇතුළත් කර ගත හැක. එසේම “වාර්තාකරණ පදනම” යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය - අදාල නැත

රු. ,000

ආදයම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තු වේ % ලෙස

3.7වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදනප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	404,000	439,607.25	430,577.389	97%
ප්‍රාග්ධන	1,767,000	1,773,247.75	958,621.633	54%
මුළු එකතුව	2,171,000	2,212,855	1,389,199.022	

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල %ලෙස
			මුල්ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
1	ජල සම්පාදන අමාත්‍යාංශය	නවජල ව්‍යාපෘති ඉදිකිරීම, පවතින ජලව්‍යාපෘති පුනරුත්ථාපනය, වකුගඩු රෝග නිවාරණය, ,වැසි ජල ටැංකි ඉදි කිරීම, සනීපාරක්ෂක පහසුකම්				
2	නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය	උතුරු නැගෙනහිර පළාත් වල නැවත පදිංචි කිරීමේ කටයුතු				

		වේගවත් කිරීම (නැනෝ පිරිපහදු පද්ධති ලබාදීම)				
3	රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය- උපාධිදාරි අභ්‍යාසලාභී	උපාධිධාරි අභ්‍යාසලාභී දීමනාගෙවීම				

3.8 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2024 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2024 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණ යට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්				
9152	යන්ත්‍රෝපකරණ		125,984,832.77		
9153	ඉඩම්				
9154	අස්පෘෂ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

3.10විගණකාධිපතිවරයාගේ වාර්තාව**

අමුණා ඇත (ඇමුණුම් අංක 1)

04 පරිච්ඡේදය

කාර්ය සාධන දර්ශක

10.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස කත්‍ය නිමැවුම		
	100%- 90%	75%-89%	50%- 74%
නව ජල ව්‍යාපෘති 179 ක් ඉදිකිරීම.			63.3%
පවතින ජල ව්‍යාපෘති 74 ක පුනරුත්තාපනය කිරීම (අවිච්ඡේද වැඩසටහන)		84.6%	
අඩු ආදායම්ලාභීන් 294 ක් සඳහා සනීපාරක්ෂක වැසිකිළි ඉදිකිරීම.		85%	
පොදු වැසිකිළි 8ක් ඉදි කිරීම.	95%		
වකුගඩු රෝග නිවාරණය සඳහා නැනෝ පිරිපහදු පද්ධති 30ක් ස්ථාපනය කිරීම.		82%	
පවතින ජල ව්‍යාපෘති 68 ක පුනරුත්තාපනය කිරීම.			68%
ජංගම සේවා සහ දැනුවත් කිරීමේ වැඩසටහන් 5ක් සිදු කිරීම.	100%		
ප්‍රජා මූල සංවිධාන සඳහා පුහුණු වැඩසටහන් 50 ක් ක්‍රියාත්මක කිරීම	100%		
ආපදා අවස්ථා වලදී ප්‍රජා මූල ජල ව්‍යාපෘති සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.	90%		
ප්‍රජා ජල ව්‍යාපෘති සඳහා ජල ආරක්ෂණ සැලසුම් සහ භූගත ජලය පුනරාරෝපණය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.	100%		

05 පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
සැමට සුරක්ෂිත ජලය හා සනීපාරක්ෂාව	2030 වන විට ආරක්ෂිතව කළමනාකරණය කළ ජල සැපයුම	ජනගහන ආවරණ 14%	11.46%		

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

(1) ලෝක බැංකුව, UNDP, UNICEF, යුරෝපා වැනි ජාත්‍යන්තර සංවිධාන හා ආයතන වල මූල්‍ය අනුග්‍රාහකත්වය හා තාක්ෂණ දායකත්වය අඛන්ඩව ලැබීම.

(2) දෙපාර්තමේන්තුවේ කාර්යභාරය හා විෂය පථය පුලුල්වීම මත ජලයෙන් දැඩි පීඩාවට පත් දුෂ්කර හා අති දුෂ්කර ගම්මාන වලට විකල්ප ජලමූලාශ්‍ර ඔස්සේ සුරක්ෂිත පානීය ජලය සැපයීමට හැකියාව ලැබීම.

(3) පවතින ප්‍රජා ජල ව්‍යාපෘති වල තිරසාරත්වය පවත්වා ගැනීමේ අරමුණින් යුතුව, එම ජල ව්‍යාපෘති සඳහා පුනරුත්තාපන සහ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති සිදු කිරීම හා ප්‍රජා මූල සංවිධාන වල නිලධාරීන් සහා අවශ්‍ය පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

(4) සියළු ජල ව්‍යාපෘති මගින් සුරක්ෂිත පානීය ජලය ලබා දීමේ අරමුණින් යුතුව ජල ආරක්ෂණ සැලසුම් සකස් කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සහ ජල ආරක්ෂණ සැලසුම් විගණනය සඳහා විගණක වරුන් පුහුණු කර විගණනය ආරම්භ කිරීම.

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / අතිරික්ත
ජ්‍යේෂ්ඨ	36	18	18
තෘතීයික	1	1	-
ද්විතියික	442	376	66
ප්‍රාථමික	70	42	28

*2024.12.31 දින වන විට **මාණ්ඩලික නිලධාරීන් 01ක්** දේශිය වැටුප් රහිත නිවාඩු ලබා ඇති අතර, **මාණ්ඩලික නිලධාරීන් 01ක්** හා **අනෙකුත් නිලධාරීන්** (ද්විතීයික/ප්‍රාථමික) 25ක් විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇත.

06.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය දැඩි බලපෑමක් එල්ල කරනු ලබයි. 2024.12.31 දින වන විට මෙම දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලය 548 ක් වන අතර විවධ ශ්‍රේණි යටතේ අනුමත වී ඇති තනතුරු නාම 18 සඳහා පුරප්පාඩු 62 පවතී. විශේෂයෙන්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත වී ඇති "තාක්ෂණ නිලධාරී" තනතුරු 40 අතුරින් 13ක් පුරප්පාඩු වී පැවතීම හේතුවෙන් රාජකාරී කටයුතු විශාල පරිශ්‍රමයක් දරා කළමනාකරණය කර ගන්නා අතර, ඒකාබද්ධ රියදුරු සේවයේ තනතුරු 36 අනුමත වී ඇති නමුත් 2024.12.31 දිනට සේවයේ යෙදී සිටින්නේ රියදුරන් 17 ක් පමනි.

මෙම මානව සම්පත් හිඟය දෙපාර්තමේන්තුවේ එදිනදා කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව පවත්වාගෙන යාමට විශාල බාධාවක් වී ඇත. ජ්‍යෙෂ්ඨ මට්ටමේ සිට ප්‍රාථමික මට්ටම දක්වා පවත්නා මානව සම්පත් හිඟය උපරිම අයුරින් කළමනාකරණය කර ගනිමින් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය උපරිම මට්ටමින් පවත්වාගෙන යාමට කටයුතු කිරීමේ අභියෝගයට සියළුම නිලධාරීන් සිය දායකත්වය සපයනු ලබයි.

දෙපාර්තමේන්තුවේ විෂය පථය හා කාර්යභාරය තුල සංවර්ධන ව්‍යාපෘති රාශියක් සමස්ථ දිවයිනම ආවරණය කරමින් සිදුකරන මොහොතක නිළධාරීන්ගේ හිඟය විශේෂයෙන්ද ව්‍යාපෘති ඇස්තමේන්තු කිරීම , අධීක්ෂණය හා සුපරීක්ෂනයට දැඩි බලපෑමක් එල්ල කර ඇත.

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

07 පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව

7.1 අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවේ.	වාණිජ අත්තිකාරම් ගිණුම සකස් නොකරයි	මෙම ගිණුම් වලට අදාල ගනුදෙනු දෙපාර්තමේන්තුව විසින් සිදු නොකරයි
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ.	ගබඩා අත්තිකාරම් ගිණුම් සකස් නොකරයි	මෙම ගිණුම් වලට අදාල ගනුදෙනු දෙපාර්තමේන්තුව විසින් සිදු නොකරයි
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ.	විශේෂ අත්තිකාරම් ගිණුම් සකස් නොකරයි	මෙම ගිණුම් වලට අදාල ගනුදෙනු දෙපාර්තමේන්තුව විසින් සිදු නොකරයි
1.6	වෙනත්	අනුකූල නොවේ.	වෙනත් ගිණුම් සකස් නොකරයි	මෙම ගිණුම් වලට අදාල ගනුදෙනු දෙපාර්තමේන්තුව විසින් සිදු

				නොකරයි
2	**පොත්පත් හාලේඛන නඩත්තුකිරීම(මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අදාල වේ.		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල නොවේ.		උප පත්‍රිකා ලේඛණය පවත්වාගෙන යාමට උපදෙස් දී ඇත.
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			

3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරාදීමපිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතලපවරාදී තිබීම	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ.		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අදාල නොවේ.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල නොවේ.	ව්‍යාපෘති සඳහා ඉදිරිපත් වන විගණන විමසුම් පිළිබඳ ඊට අදාල ව්‍යාපෘති පරික්ෂාකර බලා පිළිතුරු ඉදිරිපත් කළ යුතුය. සිටින සීමිත තාක්ෂණික කාර්ය මණ්ඩල මගින් ඒ සඳහා	කඩිනමින් අදාළ පිළිතුරු ඉදිරිපත් කිරීමට ඒ ඒ නිළධාරීන් දැනුවත් කිරීම.

			පිළිතුරු ලබා ගැනීමේදී නියමිත දිනට පිළිතුරු ඉදිරිපත් කිරීම අපහසු වී ඇත.	
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අදාල නොවේ.		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අදාල නොවේ.		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ.		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ.		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMAචක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අදාල නොවේ.		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු	අනුකූල වේ.		

	සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකරතිබීම			
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛඅංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ.	සීමිත කාර්ය මණ්ඩලය තුළ නියමිත දිනට සමීක්ෂණ කටයුතු සිදු කිරීම අපහසු වීම	කඩිනමින් පිළිතුරු ඉදිරිපත් කිරීම සඳහා නිළධාරින් දැනුවත් කිරීම
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල නොවේ.	සීමිත කාර්ය මණ්ඩලය තුළ නියමිත දිනට සමීක්ෂණ කටයුතු සිදු කිරීම අපහසු වීම	කඩිනමින් පිළිතුරු ඉදිරිපත් කිරීම සඳහා නිළධාරින් දැනුවත් කිරීම
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල නොවේ.	භාණ්ඩ අපහරණය සිදු නොකිරීම	
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල නොවේ.	වෙනත් ආයතනවලින් වාර්තා හා අනුමැතිය ලබා ගැනීමට කාලයක් ගතවීම.	අදාල වෙනත් ආයතන වෙතින් ලබාගත යුතු වාර්තාවන් නිසි පරිදි ලබා ගැනීම.
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ	අනුකූල වේ.		

	3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම			
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ.		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල නොවේ.	අක්‍රීය බැංකු ගිණුම් නොමැත	
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ.		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම.	අනුකූල වේ.		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල නොවේ.	කල් ඉකුත් වූ පොදු තැන්පත් ගිණුම පැවතීම.	

13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ.		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ.		
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ.		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ.	දෙපාර්තමේන්තුව විසින් ආදායම් රැස් කිරීම සිදු නොකරයි	
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ.		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරතිබීම	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		

17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ.		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ.		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ.		

19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල වේ.		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.		

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා එකග වූ රාජ්‍යක් ලෙස ශ්‍රී ලංකාව

2030 වර්ෂයේදී සැමට සුරක්ෂිත පානීය ජලය සැපයීම සඳහා සැලසුම් කර ඇත. එම ඉලක්ක ළගා කර ගැනීම අරමුණු කර, පානීය ජල සම්පාදන ක්ෂේත්‍රය සඳහා රජය විසින් ප්‍රමුඛස්ථානයක් ලබා දී ඇත.

විශේෂයෙන්ම, ග්‍රාමීය ජල සම්පාදන ක්ෂේත්‍රය හරහා මෙම ඉලක්කය කරා ලඟා වීම සඳහා ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව විසින් පවතින සම්පත් කළමණාකරනය කර ගනිමින් දැඩි කැපවීමෙන් කටයුතු කරන ලදී. ඒ සඳහා විශේෂයෙන් දායක වූ දේශපාලන අධිකාරී සියළුම නිලධාරීන් හා ප්‍රජාව මේ අවස්ථාවේ දී සිහිපත් කරමි.

මෙම ඉලක්කය කරා ලඟාවීමේදී නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය යටතේ ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව වෙත පවරා ඇති විෂය පථය හා වගකීම තුල 2024 වර්ෂයේ ඉටුකරන ලද කාර්ය සාධනය පිලිබඳ තොරතුරු වර්ෂ අවසානයේ පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමේ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවය සපුරාලනු වස් මෙම සංක්ෂිප්ත වාර්තාව සකසන ලදී.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No.: ඩකජ්එස්/ඩී/ඩීඑන්සීඩබ්ලිව්එස්/එෆ්/2024

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2025 මැයි 28 දින

Department of National Community Water Supply
02 JUN 2025
Director General Office

අධ්‍යක්ෂ ජනරාල්

ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව

ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

යථෝක්ත වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

එම්.ඒ.එස්.පුෂ්පරාණි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පිටපත: අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

ලේකම්, නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඩබ්ලිව්ඩී/ඩී/ඩීඑන්සීඩබ්ලිව්එස්/එෆ්ඒ/20

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2025 මැයි 28 දින

අධ්‍යක්ෂ ජනරාල්

ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව

ශීර්ෂය 332 - ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 332 - ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 හි

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

සදහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තිය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූලධන වියදම්

(අ) දෙපාර්තමේන්තුව විසින් මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම්, මූලධන වත්කම් අත්පත්කර ගැනීම සහ වෙනත් මූලධන වියදම් සඳහා දරන ලද රු.957,678,519 ක් වූ වියදම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ දැක්විය යුතු වුවද, මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ දක්වා තිබුණි.

(ආ) 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 හි 7.7 ඡේදය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය මුදල් සහ හරස් සටහන් යන දෙකම සැලකිල්ලට ගෙන පිලියෙළ කල යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අත්තිකාරම් අයකර ගැනීම් සහ අත්තිකාරම් ගෙවීම්වලට අදාල පිළිවෙලින් රු.3,779,742 ක් සහ රු.1,558,017 ක් වූ හරස් සටහන් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස්කිරීමේදී සැලකිල්ලට ගෙන නොතිබුණි.

1.6.2 මූල්‍ය නොවන වත්කම්

(අ) මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි ප්‍රවාහන උපකරණ ශේෂය තුල රු.10,700,000 ක් වටිනා වෙනත් ආයතනවලට අයත් මෝටර් වාහන 04 ක් ඇතුලත්ව තිබුණි.

(ආ) නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් නමින් ලියාපදිංචි කර ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (WaSSIP) මඟින් දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබූ යතුරු පැදි 53 ක වටිනාකම තක්සේරු කර 2024 දෙසැම්බර් 31 වන විටත් ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවට අයත් නොවූ රු.100,000 ක් හා රු.200,000 ක් වටිනා වාහන 02 ක් ස්ථාවර වත්කම් ලේඛණයේ හා ගිණුම් ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.6.3 අග්‍රිම ශේෂය

2024 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයේ SA-70 ප්‍රකාශයේ දක්වා තිබූ අග්‍රිම ගිණුමේ ශේෂය වූ රු.4,020,457 ක් මූල්‍ය ප්‍රකාශනවල ACA-3 ප්‍රකාශයේ 2024 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය ලෙස සටහන් කර නොතිබුණි. තවද එම වටිනාකමින් අග්‍රිම ගිණුමේ ශේෂය සහ දෙපාර්තමේන්තුවේ පොත් අතර ශේෂයේ වෙනසක් වූ අතර එම වෙනසට හේතුව ACA-3 ප්‍රකාශයේ දක්වා නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව 2023 වර්ෂයේ විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවේ 1.6.2(ආ) ඡේදය	මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් පිළිබඳ වාර්තාවෙහි රු.73,207,500 ක් වටිනා ප්‍රවාහන උපකරණ තුල රු.10,700,000 ක් වටිනා වෙනත් ආයතනවලට අයත් මෝටර් වාහන 04 ක් විධිමත් පරිදි පවරාගෙන ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කල යුතු බව.	1.6.2. (අ)

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 ට අනුව සකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය පිළිබඳව අවධානය යොමුනොකර ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් වැය විෂයන් 02 ක් සඳහා වෙන් කර තිබූ සම්පූර්ණ ප්‍රතිපාදනම සහ වැය විෂයන් 11 ක් සඳහා වෙන්කළ ප්‍රතිපාදනවලින් සියයට 11 ක සිට සියයට 81 ක් ඉතිරි වීම නිරීක්ෂණය වී තිබුණි.

3.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

2017 අප්‍රේල් 27 දිනැති මුදල් අමාත්‍යාංශයේ අංක 255/2017 දරණ චක්‍රලේඛයේ (2)(අ), (ආ) සහ 03 වගන්ති ප්‍රකාරව බැදීම් හා බැරකම් හඳුනා ගෙන CIGAS වැඩසටහනට ඇතුලත් කිරීමට පියවර ගත යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණ අතර විගණන නියැදි පරීක්ෂාවට භාජනය වූ 2025 වර්ෂයේ මුල් මාස දෙක තුළ 2024 වර්ෂයට අදාල ගෙවීම්වල එකතුව රු.12,567,607 ක් වී තිබුණි.

3.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

නිවාස හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය සහ ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය විසින් ග්‍රාමීය ජල ව්‍යාපෘති සහ වෙනත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා 2024 වර්ෂය තුලදී ලබාදී තිබූ එකතුව රු.146,886,750 ක් වූ ප්‍රතිපාදනවලින් රු.39,789,235 ක් එනම් සියයට 27 ක් දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපාදන ලබාදුන් කාර්යයන් වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි.

3.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, මෙම වාර්තාවේ 4.5 ඡේදයේ සඳහන් කර ඇති පරිදි විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති,රීති,රෙගුලාසිවලට යොමුව		අනුකූල නොවීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි (i) අංක 104,105	ගාල්ල දිස්ත්‍රික් කාර්යාලයේ ගබඩාවේ තිබූ රු.38,100 ක් වටිනා Gate Valve 07 ක් සහ Air Valve 03 ක් අස්ථානගත වී වර්ෂ 03 ක් ඉක්ම ගොස් තිබුණද ඒ පිළිබඳ පරීක්ෂණ පවත්වා වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන රජයට සිදුවී ඇති පාඩු ආවරණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.
	(ii) අංක 215	දෙපාර්තමේන්තුව විසින් 2024 දෙසැම්බර් 31 දින වන විට මිලදීගැනිමට කටයුතු කල රු.30,764,308 ක් වටිනා භාණ්ඩ සම්බන්ධයෙන් චෙක්පත් නිකුත් කර තිබුණද භාණ්ඩ ලැබී නොතිබූ අතර භාණ්ඩ අයිතම 4 ක් සඳහා නිකුත් කල රු.20,990,881 ක් වටිනා චෙක්පත් 2025 පෙබරවාරි 28 දින වන විටත් නිශ්කාෂණය වී නොතිබුණි. තවද, මෙම භාණ්ඩ විගණන දිනය වූ 2025 අප්‍රේල් 10 වන විටත් ගබඩාවට ලැබුණු බවට තහවුරුවක් නොතිබුණි.
(ආ)	2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 03 වන වගන්තිය	ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතය මගින් නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සම්බන්ධ වාර්තා විධිමත්ව පවත්වාගෙන යායුතු වුවත් දෙපාර්තමේන්තුවට අයත් දිස්ත්‍රික් කාර්යාල 11 ක 69 ක් වූ සේවක මණ්ඩලයට අදාල පැමිණීම හා පිටවීම වාර්තා කිරීමට ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි.

(ඈ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය	
(i) 2.6.1 (VI) ඡේදය	දෙපාර්තමේන්තුව වෙත 2024 හා 2025 වර්ෂ සඳහා වාහන කුලියට ගැනිම වෙනුවෙන් සකස් කල පිරිවිතරවලට අනුව වාහන නිෂ්පාදනය කර වසර 16 කට සහ ලියාපදිංචි කාලය වසර 11 කට වඩා අඩු වාහන මිලදී ගත යුතු වුවත්, තාක්ෂණික ඇගයීම් කමිටු අනුමැතියකින් තොරව පිලිවෙලින් වර්ෂ 15 ක් හා 10 ක් ලෙස පිරිවිතර වෙනස්කර ලංසු ලේඛන කොන්ත්‍රාත්කරුවන් වෙත නිකුත් කිරීමට අධ්‍යක්ෂ ප්‍රසම්පාදන කටයුතු කර තිබුණි.
(ii) 5.4.8 ඡේදය	ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක වැඩ අවසන් කිරීමට අපේක්ෂිත දිනය පසු වී දින 28 ක් දක්වා කාර්යසාධනය සුරක්ෂණය වලංගු විය යුතු වුවත්, මැණික්කඩවර ජල ව්‍යාපෘතියේ මහපල්ලේගම ගම්මානයේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව නිමකිරීම නියමිත දින පසුවී මාස තුනක් පමණ ප්‍රමාද වී තිබුණද, එම කාලපරිච්ඡේදයට අදාලව කාර්යසාධන සුරක්ෂණය දීර්ඝ කර ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ඇ) ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය 7.9.2(ක) ඡේදය	ලංසුව හා ඉංජිනේරුවරයාගේ ඇස්තමේන්තුව අතර විශාල වෙනසක් දක්නට ලැබේ නම්, එම හේතු විශ්ලේෂණය කිරීම අවශ්‍ය වේ. එමෙන්ම මිල ගණන් කෙරෙහි බලපෑමට තුඩුදිය හැකි අසාමාන්‍ය ප්‍රතිපාදන අනාවරණය කර ගැනීම සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුව සමාලෝචනය කලයුතු අතර ප්‍රවර්ථන වෙළඳපල තත්ත්වයන්ද විශ්ලේෂණය කලයුතු වේ. එසේ වුවත් මැණික්කඩවර ව්‍යාපෘතියට අදාල කොන්ත්‍රාත්තුවේදී ලංසුකරු විසින් ඉංජිනේරු ඇස්තමේන්තුවේ සඳහන් රේටයන්ට වඩා අඩු මිල ගණන් සියයට 43 සිට සියයට 87 දක්වාද වැඩිමිල

ගණන් සියයට 51 සිට සියයට 211 දක්වාද වූ පරාසයන් තුල ඉදිරිපත් කර තිබූ අතර එම විෂමතාවයන්ට හේතු විශ්ලේෂණය නොකර විධිමත් පරිදි ලංසු ඇගයීමකින් තොරව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 දැක්ම හා මෙහෙවර

ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත සඳහා 2014 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී වර්ෂ 10 ක් ගත වී තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාල පනත සම්මත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව ආරම්භ කිරීමට අදාල කැබිනට් පත්‍රිකාවේ සඳහන් ප්‍රජා ජල යෝජනාක්‍රමවලට අදාලව ප්‍රජා මූල සංවිධාන සඳහා ව්‍යවස්ථා, චක්‍රලේඛ, ගිවිසුම් සම්පාදනය කිරීම, එම සංවිධාන විසින් කරනු ලබන කාර්යයන් අධීක්ෂණය, සාධාරණ ගාස්තු අය කිරීමේ ක්‍රමවේදයන් සකස් කිරීම හා පවත්වාගෙන යාම වැනි කාර්යයන් සිදුකිරීමට දෙපාර්තමේන්තුවට නෛතික පසුබිමක් නොතිබුණි.

4.1.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

(අ) ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව මගින් පුත්තලම දිස්ත්‍රික්කයේ ජල ව්‍යාපෘති 04 ක් සඳහා ජලය පිරිපහදු කිරීමේ මධ්‍යස්ථාන 04 ක් ඉදිකර පිරිපහදු යන්ත්‍ර (Package Plant) සපයා සවිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් වෙත 2022 මාර්තු 24 වන විට රු.16,383,889 ක් ගෙවීම් කර තිබුණි. ප්‍රජාමූල සංවිධාන මගින් සිදුකර තිබූ ජල තත්ත්ව පරීක්ෂණ වාර්තා අනුව පිරිපහදු කරන ලද හා නොකරන ලද ජලයේ වෙනසක් නිරීක්ෂණය වී නොතිබුණි. ඒ අනුව, මෙම පිරිපහදු යන්ත්‍ර මගින් ලබාදෙන ජලයේ ගුණාත්මකබව පිලිබඳ පාරිභෝගික විශ්වාසය නොමැතිවීම, එම ව්‍යාපෘති ආසන්නයේම නැනෝ තාක්ෂණය මගින් ජලය පිරිපහදු කරනු ලබන ව්‍යාපෘති පැවතිම වැනි හේතුන් මත ජල ඉල්ලුම අඩුවී විගණිත දින වූ 2024 අගෝස්තු 29 දින වනවිට මෙම යන්ත්‍ර ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණි. ඒ අනුව ඒ සඳහා වැයකරන ලද සම්පූර්ණ මුදල නිශ්කාර්ය වී තිබුණි.

(ආ) පුත්තලම දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරන ලද විගණන නියැදි පරීක්ෂාවට භාජනය වූ ප්‍රජා ජල අභිමානී ව්‍යාපෘති 56 කින් ව්‍යාපෘති 24 කට අදාලව කාලීනව ජලතත්ත්ව පරීක්ෂණ වාර්තා ලබාගෙන නොතිබූ අතර ඉතිරි ව්‍යාපෘති 32 ට අදාලව ජල තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබාගැනීම වර්ෂ 1-4 දක්වා කාලයට පෙර සිදුකර තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන සනීපාරක්ෂක පහසුකම් ලබාදීමේ ව්‍යාපෘතිය මගින් එක් පවුලකට රු.50,000 ක් ලබාදීම සඳහා 2020, 2021 හා 2022 වර්ෂ තුලදී පුත්තලම දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභී පවුල් 342 ක් තෝරාගෙන එයින් පවුල් 120 ක් සඳහා රු.40,000 බැගින් රු.4,800,000 ක් ගෙවා තිබුණි. නිසි අධීක්ෂණයක් යටතේ එම කටයුත්ත සිදු නොකිරීම හේතුවෙන් අදාළ ඉදිකිරීම් විගණිත දිනය වූ 2024 අගෝස්තු වන විටත් අවසන් නොකර පැවතීමෙන් එම ගෙවන ලද මුදල් නිශ්කාර්ය වී තිබුණි.

4.1.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම.

එකතුව රු.43,277,707 ක මුදලක් වැය කර ඉදිකරමින් පැවති පුත්තලම දිස්ත්‍රික්කයේ මාදම්පේ හේනේපොළ නිල්දිය දහර ව්‍යාපෘතිය, කරුවලගස්වැව ගැමි සරණ ව්‍යාපෘතිය, නාත්තණ්ඩිය සියශක්ති ප්‍රජා ජල ව්‍යාපෘතිය යන ව්‍යාපෘතිවල කටයුතු විවිධ හේතු මත අතර මග නැවතී තිබූ අතර ඒ සඳහා වැයකරන ලද මුදල් අනාර්ථික වියදම් බවට පත්ව තිබුණි.

4.1.4 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

(අ) ප්‍රජා ජල අභිමානී වැඩසටහන යටතේ 2020-2021 වර්ෂවල ඉදිකිරීම් ආරම්භ කරන ලද ව්‍යාපෘතින් 244 න් 205 ක්ද 2019-2020 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කළ ව්‍යාපෘතින් 05 ක්ද විවිධ හේතුන් මත 2024 දෙසැම්බර් 31 වන විටත් අවසන් වී නොතිබූ අතර ඒ සඳහා රු.1,754,058,041 ක මුදලක් වැය කර තිබුණි. ව්‍යාපෘති ආරම්භ කර වසර 5 ක් ඉක්ම ගොස් තිබුණද මෙම ව්‍යාපෘති අවසන් කර ජනතාවට ජලය ලබාදීමට අපොහොසත් වීමෙන් ඒ වෙනුවෙන් වැය කළ මුදල් නිෂ්කාර්යය වී තිබුණි.

(ආ) නියැදි පරීක්ෂාවට ලක්වූ කෑගල්ල දිස්ත්‍රික්කයේ මැණික්කඩවර හා මහ පල්ලේගම ගම්මානවල පවුල් 800 ක ජනතාවට පිරිසිදු පානීය ජලය ලබාදීමේ අරමුණින් 2019 වර්ෂයේ ආරම්භ කර තිබූ ජල ව්‍යාපෘතියෙහි මුල් ඇස්තමේන්තුව රු.මිලියන 68 ක් වූ අතර ව්‍යාපෘති භූමිය නායයෑමට ලක්වීම හේතුවෙන් 2023 වර්ෂයේ මෙහි ඇස්තමේන්තුගත මුදල රු.මිලියන 120.5 ක් ලෙස සංශෝධනය කර තිබුණි. ඒ වන විට ළිඳ, ගබඩාටැංකිය, පොම්පාගාරය, පැතිබැම්ම ඉදිකිරීමට හා ජලනල හා උපාංග මිලදී

ගැනීම වෙනුවෙන් රු.මිලියන 32.86 ක් වැය කර තිබුණි. රු.1,459,604 ක් වැයකර ඉදිකර තිබූ ළිඳෙහි ජලය ප්‍රමාණවත් නොවීම මත භාවිතයට ගෙන නොතිබුණි. එමෙන්ම නායයාමට ලක්වීමෙන් ආරක්ෂාවීම සඳහා රු.2,031,924 ක් වැයකර ඉදිකර තිබූ පැතිබැම්ම ප්‍රමාණවත් නොවීම මත 2024 වර්ෂයේදී භූ විද්‍යා හා පතල් කාර්යාංශයේ නිර්දේශ අනුව රු.25,113,347 ක ඇස්තමේන්තු පිරිවැයක් මත බැම්මක් ඉදිකිරීම සඳහා නව කොන්ත්‍රාත්කරුවකු තෝරාගෙන තිබුණි.

ඉහත කී මුල් ව්‍යාපෘතියේ ජලය ප්‍රමාණවත් නොවීම මත මහපල්ලේගම ගම්මානය සඳහා ඉදිකර තිබූ නල ළිඳකින් ජලය ලබාගැනීමට කටයුතු කර ඊට අදාල පොම්පාගාරය හා ජලය බෙදා හැරීමේ පද්ධතිය ඉදිකිරීම් සඳහා තවත් රු.40,304,273 ක ඇස්තමේන්තු පිරිවැය මත වූ කොන්ත්‍රාත්තුව 2024 වර්ෂයේ ජූලි 24 දින පුද්ගලික ආයතනයක් වෙත පිරිනමා තිබුණි. ගිවිසුම ප්‍රකාරව මෙම කොන්ත්‍රාත්තුව 2024 නොවැම්බර් 01 දින අවසන් කල යුතු වුවත් 2024 දෙසැම්බර් 31 වන විට රු.17,718,047 ක මුදලක් වැයකර තිබුණද වැඩ අවසන් වී නොතිබුණි. තවද මෙම කොන්ත්‍රාත්තුව යටතේ ඉදිකර තිබූ පොම්පාගාරයේ ඉදිකිරීම් අඩුපාඩු සහිත වූ අතර නියමිත පරිදි ජලනල එළීම සිදුකර නොතිබුණි .

ජල පිරිපහදු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා භූමිය හා මාර්ගය ඉදිකිරීම වෙනුවෙන් (Site work) රු.917,345 ක් 2022 මාර්තු 30 දින සිසිලස ප්‍රජා මූල සංවිධානය වෙත ගෙවීම් කර තිබුණද 2025 මාර්තු වන විටත් පිරිපහදු මධ්‍යස්ථානයක් ඉදිකර නොතිබූ අතර ඒ සඳහා වැයකල මුදල නිශ්කාර්ය වී තිබුණි. 2024 දෙසැම්බර් 31 වන විට මෙම ව්‍යාපෘතිය සඳහා රු.50,581,931 ක් වැයකර තිබුණද වර්ෂ 5 ක් ගත වී ඇතත් කිසිදු පාරිභෝගිකයෙකුට ජලය ලබාදීමට අපොහොසත් වී තිබුණි. කෙසේ වුවද මෙම ව්‍යාපාතිය අසාර්ථකවීම කෙරෙහි එය සැලසුම් කල අවස්ථාවේ සිට එයට සම්බන්ධ වූ නිළධාරීන් වගකිවයුතු වුවත් ඒ පිළිබඳ කිසිදු පියවරක් නොගෙන ප්‍රතිලාභ අපේක්ෂිත ජනතාවට තම සේවාවද ඉටු නොකර දිගින් දිගටම මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් රජයේ මුදල් නිශ්කාර්ය ලෙස වැය කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණි.

4.1.5 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

වකුගඩු රෝගයෙන් පීඩා විඳින ජනතාව වෙනුවෙන් දිස්ත්‍රික්ක 11 ක නැනෝ පිරිපහදු යන්ත්‍ර 140 ක් මාස 10 ක් තුළ සවි කිරිම සඳහා 2021 වර්ෂයේ දෙපාර්තමේන්තුව විසින් පෞද්ගලික ආයතනයකට කොන්ත්‍රාත් පිරිනමා ඒ සඳහා රු.400,393,519 ගෙවා තිබුණි. ඉන් දිස්ත්‍රික්ක 04 ක

ප්‍රතිලාභීන් 5414 කට ජලය සැපයීමේ අරමුණින් ස්ථාපනය කරන ලද පිරිවැය රු.47,372,019 ක්වූ නැනෝ පිරිපහදු යන්ත්‍ර 18 ක් 2025 පෙබරවාරි වන විට ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි. එමෙන්ම ප්‍රතිලාභීන් 25,497 කට රු.183,451,853 ක් වැයකර දිස්ත්‍රික්ක 04 ක ස්ථාපනය කරන ලද නැනෝ පිරිපහදු යන්ත්‍ර 54 කින් ජලය සැපයීමට හැකි වී තිබුණේ ප්‍රතිලාභීන් 3835 කට පමණි. එමෙන්ම 2025 පෙබරවාරි වන විටත් ඇස්තමේන්තු පිරිවැය රු.45,712,360 ක්වූ ප්‍රතිලාභීන් 7310 කට ජලය සැපයීමට සැලසුම් කළ පිරිපහදු යන්ත්‍ර 22 ක් ස්ථාපනය කර නොතිබුණි.

කිලිනොච්චිය, වව්නියාව, මුලතිව් යන දිස්ත්‍රික්කවල වටිනාකම රු.193,898,520 ක්වූ පිළිවෙලින් නැනෝ පිරිපහදු යන්ත්‍ර 23 ක්, 23 ක් හා 04 ක් ස්ථාපනය කිරීමට සැලසුම් කර තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව අවසන් කර 2024 වර්ෂයේ නොවැම්බර් මස වන විට ගෙවූ අවසන් බිල්පත අනුව කල වැඩ වටිනාකම රු.174,274,077 ක් වී තිබූ අතර ඒ අනුව ගිවිසුම්ගත කාර්යන්ගෙන් රු.19,619,443 ක වැඩ කොටස් ඉටුකර නොතිබුණි. මෙම යන්ත්‍ර සවිකිරිම අනුමත ප්‍රමිතියට අනුව සිදු කර නොතිබුණු බව විගණන නියදි පරීක්ෂණවලදී අනාවරණය වී තිබුණු අතර විදුලි උපාංග සවි නොකර තිබියදී හා ස්ථාන කිහිපයක ජල මෝටර් හා පොම්ප නොතිබියදී ඉංජිනේරුවරයා හා තාක්ෂණික නිලධාරි විසින් වැඩ නිම කල බවට ලබාදුන් සහතික මත ගෙවීම් කර තිබුණි.

4.1.6 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

4.2 ප්‍රසම්පාදනයන්

(අ) කළුතර, බුලත්සිංහල උතුර නාගරික සංවර්ධන පදනම ජල ව්‍යාපෘතිය වෙත රු.35,376,959 ක් වටිනා GI බට හා උපාංග 2024 මාර්තු 15 දින පෞද්ගලික ආයතනයකින් මිලදී ගෙන තිබුණි. ලංසුකරු ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුව ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා රු.6,496,371 ක් එනම් සියයට 17.39 කින් වැඩි වී තිබූ අතර ඒ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කාර්යය සංග්‍රහයේ 7.9.2(ක) ප්‍රකාරව විෂමතාවයට හේතු විශ්ලේෂණය කර නොතිබුණි. කොන්ත්‍රාත් ලේඛන අනුව ජල නල මත DNCWS නම, නිෂ්පාදන දිනය, PN රේටින්, Outside Diameter සඳහන් කර තිබිය යුතු වුවත් සපයා තිබූ බටවල එම සලකුණු නොතිබුණි. එමෙන්ම ලංසුකරුවන් සඳහා වූ උපදෙස් අංක 35.4

ප්‍රකාරව පිරිවිතරයන්, බ්‍රිතාන්‍ය ප්‍රමිත අංක BS 1387-1985 ට අනුකූල බව තහවුරු කරගෙන නොතිබුණි. මෙම ජලනල එළීමේ කටයුතු නාගරික සංවර්ධන පදනම් ප්‍රජා මූල සංවිධානය විසින් සිදුකර තිබූ අතර එම කටයුතු 2024 මැයි 16 දින වනවිට අවසන් කල යුතු වුවත් විගණිත දිනය වූ 2025 ජනවාරි වන විටත් එම කටයුතු අවසන් වී නොතිබූ බැවින් ඊට අදාල රු.6,003,020 ක් වටිනා GI බට හා උපාංග ප්‍රයෝජනයට ගෙන නොතිබුණි .

(ආ) දෙපාර්තමේන්තුව විසින් රු.30,764,308 ක් වටිනා පරිගණක ඇතුළු කාර්යාල උපකරණ හා ඇඟිලි සලකුණු යන්ත්‍ර මිලදී ගැනීමට කටයුතු කර තිබූ අතර ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුලත් නොවූ මෙම මිලදී ගැනීම සඳහා 2024 දෙසැම්බර් මස ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබාදී තිබුණි. තවද එම මිලදී ගැනීම් ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුගත නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

(i) ඇඟිලි සලකුණු යන්ත්‍ර මිලදී ගැනීමේදී 2024 දෙසැම්බර් 12 දින මිල කැඳවීමට පෙර දෙපාර්තමේන්තුව විසින් 2024 අගෝස්තු මස 20 දින රාජ්‍ය වානිජ (විවිධ) නීතිගත සංස්ථාවෙන් කල විමසීමට අනුව යන්ත්‍ර 11 ක් සඳහා ඉදිරිපත් කළ මිල රු.814,000 ක් වුවත් මීට අදාල දින රහිත තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවෙහි එය රු.1,053,671 ක් ලෙස සාවද්‍යව දක්වා තිබුණි. එමෙන්ම තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ අනුව තෝරාගත් සැපයුම්කරු ඉදිරිපත් කල යන්ත්‍ර සඳහා Standard Functions විස්තර ඉදිරිපත් කර නොතිබූ බැවින් ඒ පිලිබඳ පැහැදිලි කිරීම් ලබාගෙන කොන්ත්‍රාත් ප්‍රදානය කරන ලෙස දක්වා තිබුණද එම නිර්දේශ නොසලකා එම පෞද්ගලික ආයතන වෙත රු.770,000 මුදලකට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.

(ii) පරිගණක මිලදී ගැනීමට අදාලව 2024 දෙසැම්බර් 24 දින නිකුත්කරන ලද කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ලිපියෙහි ලැප්ටොප් පරිගණක සංඛ්‍යාව එක් ස්ථානයක 20 ක් ලෙසත් තවත් ස්ථානයක 13 ක් ලෙසත් සඳහන් වී තිබුණි. ඒ අනුව නිසි සැලකිල්ලකින් තොරව කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ලිපිය නිකුත් කර තිබුණි.

(iii) 2024 අගෝස්තු 30 දිනැති අධ්‍යක්ෂ (පාලන) ගේ ලිපිය ප්‍රකාරව මෙම මිලදී ගැනීමෙහි ඇතුලත් Multimedia Projectors වල අවශ්‍යතාව 08 ක් බව දැනුම් දී

තිබූ අතර යන්ත්‍ර 17 ක් මිලදී ගැනීමට කටයුතු කර තිබුණි. ඊට අදාල වෙනත් ඉල්ලීම් ලිපිගොනුවෙහි නොතිබුණි.

(iv) වෙළඳපොල මිල සැදැහුම් ක්‍රමය යටතේ Multifunction Printers මිලදී ගැනීමේදී 2023/2024 වර්ෂ සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ නාම ලේඛණයේ ඇතුලත් නොවූ ආයතන 5 කින්ද ලංසු කැඳවීම් කර තිබූ අතර සැපයුම්කරුවෙකු ලෙස ලියාපදිංචි වී නොතිබූ ආයතනයකින් එම මිලදී ගැනිම සිදුකර තිබුණි.

4.3 **වත්කම් කළමනාකරණය**

(අ) ප්‍රජා ජල අභිමානි වැඩසටහන යටතේ පුත්තලම දිස්ත්‍රික්කයේ ඉදිකිරීම් කර තිබූ ප්‍රජා ජල ව්‍යාපෘති 07 ක් 2024 ඔක්තෝම්බර් වනවිටත් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් 2023 දෙසැම්බර් මස එම ව්‍යාපෘති සඳහා ලබා දී තිබූ රු.23,492,999 ක් වටිනා PVC ජලනලද රු.10,112,025 ක් වටිනා වතුර මීටර් ද නිවෙස්වල, විහාරස්ථානවල හා පොදු ස්ථානවල අනාරක්ෂිතව ගොඩ ගසා තිබූ අතර ඒ පිළිබඳ දෙපාර්තුමේන්තුව දැනුවත්කර තිබුණද ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) මැණික්කඩවර සිසලස පානීය ජල ව්‍යාපෘතිය සඳහා මිලදීගෙන තිබූ රු.4,315,000 ක් වූ ජල පොම්ප හා උපාංගද රු.4,290,300 ක් වූ ජලමනු 945 ක්ද වසර 02 ට ආසන්නන කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන ගබඩා කර තිබුණි. එමෙන්ම 2020 ඔක්තෝම්බර් මස රු.9,110,151 ක් වැයකර මිලට ගෙන තිබූ ජලනල හා උපාංග වලින් විශාල ප්‍රමාණයක්ද 2024 දෙසැම්බර් 31 දක්වා ප්‍රයෝජනයට නොගෙන අනාරක්ෂිත ස්ථානවල ගබඩා කර තිබූ අතර ඒවායින් වානේ /යකඩ ජල පද්ධති සම්බන්ධ කෙරෙන උපාංග විනාශයට පත්වෙමින් තිබුණි.

(ඇ) 2023 දෙසැම්බර් මස දිස්ත්‍රික්ක 07 ක ප්‍රජා මූල සංවිධාන 08 ක් වෙත රු.11,309,855 ක් වැයකර ලබා දී තිබූ ජල මීටර් 1208 කින් රු.9,267,055 ක් වටිනා ජල මීටර් 908 ක් 2025 මාර්තු 31 දින වන විටත් භාවිතයට ගෙන නොතිබුණි. ව්‍යාපෘති වැඩ අවසන් වූ පසු අවශ්‍ය වන මෙම උපාංග අවශ්‍යතාවය නොසලකා මිලදී ගෙන රජයේ මුදල් අනාර්ථික ලෙස වැය කර තිබුණි. එමෙන්ම එම ජල මීටර් භාවිතයට ගැනීමේදී ඒ සඳහා ලබා දී තිබූ වගකීම් කාලයන්ද ඉක්මවා ගොස් තිබුණි.

(ඇ) ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා ව්‍යාපෘතිය මගින් ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබූ අංක ZB-0557 දරන ජංගම ජල පරීක්ෂණ රථය 2024

සැප්තැම්බර් 27 දින සිට කිසිදු පරීක්ෂණ කටයුත්තක් සඳහා යොදා නොගෙන ලක්දිය මැදුර පරිශ්‍රයේ නවතා තිබුණි.

4.4 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

ගාල්ල ඉමදූව සවිය ජල ව්‍යාපෘතිය වෙනුවෙන් ලද රු.251,163 ක මුදලක් ගාල්ල දිස්ත්‍රික් ස්ථානභාර නිලධාරිගේ පෞද්ගලික ඉතුරුම් ගිණුමට බැර කර ගෙන තිබුණි. රජයේ මුදල් රාජ්‍ය නිලධාරියෙකුගේ පෞද්ගලික බැංකු ගිණුමට බැර කර අයථා ලෙස පරිහරණය කිරීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 156 හා ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 5.3 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

4.5 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

දෙපාර්තමේන්තුව වෙත 2024 ජූලි 09 දින නිකුත් කරන ලද අංක WAS/D/DNCWS/මූ.වි./මාතලේ/2024/01 දරන විගණන විමසුම සඳහා 2025 අප්‍රේල් 10 වන විටත් පිළිතුරු ලබා දී නොතිබුණි.

4.6 කළමනාකරණ දුර්වලතා

(අ) දෙපාර්තමේන්තුවේ මගින් ක්‍රියාත්මක කර තිබූ ප්‍රජා ජල ව්‍යාපෘති සම්බන්ධයෙන් සිදුකල විගණන පරීක්ෂාවන්වලදී 2021-2024 වර්ෂයන් තුලදි සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂණවලදි ජල ව්‍යාපෘති ඉදිකිරීමේ කොන්ත්‍රාත්වලදි ඉටු නොකරන ලද කාර්යයන් හා වැඩිපුර ගෙවීම් සිදුකල සඳහා අවස්ථා 23 කදී රු.20,338,157 ක් ගෙවා ඇති බවට අනාවරණය කර තිබුණි. එම අනාවරණයන්ට අදාලව මූලික පරීක්ෂණ පවත්වා නිර්දේශ ක්‍රියාත්මක කිරිමේදි අදාල නිලධාරින්ට ලිපි මගින් ව්‍යාපෘති ආරම්භ කිරිමට පෙර සැලකිලිමත් වියයුතු කරුණු, ජල තත්ව පරීක්ෂණ සිදු කල යුතු ආකාරය, ජල ව්‍යාපෘති නඩත්තු හා පසු විපරම් කල යුතු ආකාරය වැනි දෙපාර්තමේන්තුව මගින් මාර්ගෝපදේශ චක්‍රලේඛ මගින් නිරන්තරයෙන්, හදුන්වා දී තිබූ කරුණු පිලිබඳව සැලකිලිමත් වන ලෙස උපදෙස් හා තරයේ අවවාද කිරිමේ ලිපි පමණක් නිකුත්කර තිබුණි.
ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 156 ප්‍රකාරව කටයුතු කල යුතු වුවත් එසේ කටයුතු කර නොතිබූ අතර පාඩු සිදුකල නිලධාරින්ට එරෙහිව ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 29.1, 29.2 හා 29.3 ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කල යුතු වේ. එමෙන්ම XLVII වැනි පරිච්ඡේදයේ 8.1 වන වගන්තියට පටහැනිව රජයේ නිලධාරින් විසින් ක්‍රියාකර ඇති අවස්ථාවක එහි 8.2 වගන්තියට අනුව අදාල

නිලධාරින්ට එරෙහිව ආයතන සංග්‍රහයේ පළමු උපලේඛණයේ වරදක් ලෙස විනය බලධාරියා විසින් විනයානුකූල පියවර ගතයුතු වුවත් එසේ කර නොතිබුණි. තවද මෙම කරුණු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 128 (ඇ), (එ) සහ (ජ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) 2023/2024 වර්ෂ සඳහා දෙපාර්තමේන්තුව විසින් පෞද්ගලික සමාගමක් විසින් උදාරා කුලී පදනම මත කැබරථ 07 ක් ලබා ගැනීමට කටයුතු කර තිබූ අතර ඉන් කැබ් රථ 03 ක් නිසි පරිදි ධාවනය නොවන බව දෙපාර්තමේන්තුව වෙත ස්ථානභාර නිලධාරීන් විසින් දන්වා තිබුණි. ඊට අදාල ලංසු ලියවිලිවල ඇතුලත් කොන්ත්‍රාත් කොන්දේසි දත්ත 8.5 ප්‍රකාරව එවැනි අවස්ථාවක කොන්ත්‍රාත් කොන්දේසි කඩ කිරීම පිලිබඳව දඩ මුදල් අය කිරීමට හා පොදු කොන්දේසි අංක 2.4 ප්‍රකාරව කොන්ත්‍රාත්තුව අවසන්කර කාර්යසාධන බැදුම්කරය රාජසන්තක කිරීමත්, කොන්ත්‍රාත්තුව පැහැර හැර ඇතිලෙස ලැයිස්තුගත කිරීමත් කල යුතු වුවත් එසේ කර නොතිබුණු අතර මෙම තත්ත්වය නොසලකා කොන්ත්‍රාත්කරු වෙත කාර්යසාධන බැදුම්කරය නිදහස් කිරීමටද කටයුතු කර තිබුණි.

(ඇ) 2022 මැයි 22 දිනැති අංක 22/0508/414/003 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය හා 2022 අප්‍රේල් 26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 පාදක කර ගනිමින් දෙපාර්තමේන්තුව විසින් 2021 හා 2023 වර්ෂයන් තුලදී ලබාදී තිබූ වටිනාකම රු.මිලියන 302 ක ජල ව්‍යාපෘති ඉදිකිරීමේ කොන්ත්‍රාත් 31 ක් අන්‍යෝන්‍ය එකඟතාවය මත අවසන් කර තිබූ අතර ඒවායේ කළ වැඩ වටිනාකම 108 ක් වී තිබුණි. සියයට 50 ට වඩා වැඩ නිම කරන ලද සහ කළ වැඩ වටිනාකම රු.52,787,337 ක් වූ කොන්ත්‍රාත් 14 ක් ද ඒ අතර විය. 2024 ජනවාරි 10 දිනැති අංක 01/2024 දරණ ජාතික අයවැය චක්‍රලේඛය මගින් ඉහත කී චක්‍රලේඛය අවලංගු කර තිබුණද ඉන් පසුව රු.180,951,202 ක් වූ ව්‍යාපෘති 20 ක් ඉහත චක්‍රලේඛ දිනට පසුව අවලංගු කිරීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර තිබුණි. මෙම කොන්ත්‍රාත් අවලංගු කරන අවස්ථාවේදී කොන්ත්‍රාත් 13 ක් සඳහා ලබාදී තිබූ රු.29,310,783 ක් අත්තිකාරම් බැදුම්කරද කොන්ත්‍රාත් 14 ක් සඳහා ලබාදී තිබූ රු.6,346,593 ක්වූ කාර්යසාධන බැදුම්කරද කල් ඉකුත් වී තිබූ අතර කොන්ත්‍රාත් අවසන් කිරීමට පෙර ඉහත කී බැදුම්කර මගින් රජයට සිදුවූ පාඩුව ආවරණය කර ගැනීමට දෙපාර්තමේන්තුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුනු අතර ඒ පිලිබඳව වැඩිදුර පරීක්ෂාව සඳහා විගණනය විසින් ඉල්ලුම් කරන ලද තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. මෙම කොන්ත්‍රාත් සඳහා සම්මත ලංසු ලේඛන උපයෝගී කර නොගැනීම හේතුවෙන් කොන්ත්‍රාත් අවසන් කරන අවස්ථාවේ කොන්ත්‍රාත්කරු ඉටුනොකල වැඩ කොටස්වලින්

සියයට 20 ක ප්‍රමාණයක් නැවත අයකර ගැනීමට තිබූ අවස්ථාවද මගහැරී තිබුණි. එමෙන්ම මෙම ව්‍යාපෘතිවල ඉතිරි වැඩ සම්පූර්ණ කිරීමට පියවර ගෙන ඇති බවට තොරතුරු ලබාදී තිබුණද 2025 පෙබරවාරි වන විටත් ව්‍යාපෘති 30 ක වැඩ අවසන් කර නොතිබුණි. ඒ අනුව රජයට පාඩු සිදු කර ගනිමින් එම ව්‍යාපෘති අත්හිටුවීමෙන් අපේක්ෂා කළ අරමුණ ඉටුවී නොතිබුණි.

5. යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

2019 ජනවාරි 12 දිනැති අංක DMA/01-2019 දරණ විගණන හා කළමණාකරන දෙපාර්තමේන්තු චක්‍රලේඛයෙහි 03 ඡේදය හා 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 වන වගන්තිය ප්‍රකාරව ආයතනයක අභ්‍යන්තර විගණකයෙකු පත්කර නොමැති අවස්ථාවකදී එම පනත ක්‍රියාත්මක වීමේ දින සිට වසර 2 ක් නොඉක්මවන කාල සීමාවක් තුල දෙපාර්තමේන්තුවේ ගණන් දීමේ නිලධාරියා විසින් සුදුසු අභ්‍යන්තර විගණකවරයෙකු පත්කල යුතුව ඇති අතර 2020 වර්ෂයේ දෙපාර්තමේන්තුවට පත්කරන ලද අභ්‍යන්තර විගණන නිලධාරිනිය විධිමත් අනුමැතියකින් තොරව දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී ලෙස 2021 වර්ෂයේ පත්කිරීම හේතුවෙන් එදින සිට එම තනතුර පුරප්පාඩුව පැවතුණි.

6. මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

සේවක කාණ්ඩය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව	අතිරික්ත සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	36	18	21	03
තෘතියික මට්ටම	1	1	-	-
ද්විතියික මට්ටම	442	376	66	
ප්‍රාථමික මට්ටම	70	42	28	
එකතුව	**549**	**434**	**115**	**03**

ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත තනතුරු 36 න් තනතුරු 18 ක් ඇතුලුව සියළුම කාණ්ඩවල පුරප්පාඩු සංඛ්‍යාව සියයට 21 ක පමණ ප්‍රතිශතයක් විය. ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත තනතුරු 03 ක් සඳහා පූර්ණ කාලීන වැඩ බැලීමේ පත්වීම් 03 ක් සිදුකර තිබූ අතර අනුමත තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයින් 09 ක් ද නිරීක්ෂණය විය.

එම්.ඒ.එස්.පුෂ්පරාණි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.